# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 62 — 1973 ජූනි 01 වැනි සිකුරාද — 1973.06.01**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)**


## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය


| | පිට | | පිට |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන ... ... ... | 522 |
| ජනාධිපතිතුමාණන් කරන පත් කිරීම් ආදිය ... ... | — | මිළ පාලන දැන්වීම් ... ... ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන පත්කිරීම් ආදිය ... ... | — | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — | ආදයම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| අධිකරණ සේවා උපදේශක මණ්ඩලයෙන් කරන පත්කිරීම් ආදිය ... | — | ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශන ... ... | — |
| වෙනත් පත් කිරීම් ආදිය ... — ... | 521 | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්... ... ... | 539 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | 522 | "සුරාබදු අඥපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |


**සැළකිය යුතුයි.**—ශ්‍රී ලංකා පලතුරු මණ්ඩල පනත් කෙටුම්පත 1973 මැයි 18 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

## වෙනත් පත්කිරීම් ආදිය

1973 අංක 284

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පහත සඳහන් පත්වීම් කර ඇති බව දැනුම් දෙනු ලැබේ :—

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තියේ I ශ්‍රේණියේ, ආචාර්ය වී. රාමනාදන් මහතා නැවත නියමයක් කරනතුරු 72. 04. 01 වැනි දින සිට මහා භාණ්ඩාගාරයට අනුයුක්තව සිටීමට.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ II ශ්‍රේණියේ පී. එම්. විජේකෝන් මහතා 1972. 01. 03 දින සිට නැවත නියමයක් කරනතුරු පුනරුත්ථාපන කොමසාරිස් වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II වැනි පන්තියේ එම්. ඊ. එල්. ප්‍රනාන්දු මහතා 1972. 11. 15 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ධීවර අමාත්‍යාංශයට අනුයුක්තව සිටීමට.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ, එස්. ධර්මලිංගම් මහතා 1972. 12. 01 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, ජ්‍යෙෂ්ඨ සහකාර කම්කරු කොමසාරිස් වරයෙකු වශයෙන්.

සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකරු පංතියේ විශේෂ ශ්‍රේණියේ ලිපිකරු, ටී. ජී. එෆ්. මැන්ඩිස් මහතා 1971. 07. 27 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු කොළඹ පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ කාර්යාල සහකාර වශයෙන් වැඩ බැලීමට.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ එස්. ඩබ්ලිව්. ඒ. ද සිල්වා මහතා 72. 09. 11 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු මහා භාණ්ඩාගාරයේ සැපයීම් හා සේවක සංඛ්‍යා සහකාර අධ්‍යක්ෂවරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ එන්. ටී. බී. ප්‍රනාන්දු මහතා 72. 10. 01 දින සිට නැවත නියමයක් කරනතුරු ගොවිජන සේවා සහකාර කොමසාරිස් වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තියේ පී. ඊ. ප්‍රනාන්දු මහතා 1972. 10. 02 දින සිට නැවත නියමයක් කරන තුරු සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ කේ. ෂන්මුගනාදන් මහතා 72. 10. 03 දින සිට නැවත නියමයක් කරන තුරු ගොවිජන සේවා සහකාර කොමසාරිස් වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ පී. කේ. ඒ. ඒ ද අල්විස් මහතා 1972. 10. 28 දින සිට නැවත නියමයක් කරනතුරු, මොණරාගල පාලන දිස්ත්‍රික්කයේ (මූලස්ථාන) ප්‍රාදේශීය ආදායම් නිලධාරි වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ වී. සී. වර්ණකුලසූරිය මහතා 1972. 10. 31 දින සිට නැවත නියමයක් කරනතුරු, මොණරාගල පාලන දිස්ත්‍රික්කයේ සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි වශයෙන්.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි.**

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ හැම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. සඳහන්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.**

**1971 මාර්තු මස** 19 වැනි දින,
**ආණ්ඩුවේ මුද්‍රණ** දෙපාර්තමේන්තුව,
**කොළඹ.**

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ ඒ. ඇම්. ඇම්. සව්කත් මහතා 1972. 11. 01 දින සිට නැවත නියමයක් කරන තුරු බදුල්ල පාලන දිස්ත්‍රික්කයේ (මහජන සම්බන්ධතා) ප්‍රාදේශීය ආදායම් නිලධාරි වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ පී. කේ. ඇල්ලාලගොඩ මෙනෙවිය 1972. 11. 01 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු මුළු දිවයින සඳහා සහකාර ආහාර පාලකවරියක සහ සහකාර මිල (ආහාර) පාලකවරියක වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ ඊ. ආර්. ඕ. ද සිල්වා මහතා 1972. 11. 01 වෙනි දින සිට, නැවත නියමයක් කරනතුරු මුළු දිවයින සඳහා සහකාර ආහාර පාලක වරයෙකු සහ සහකාර මිල (ආහාර) පාලක වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ ඒ. කපුආරච්චි මහතා 1972. 11. 15 දින සිට නැවත නියමයක් කරනතුරු නුවරඑළිය පාලන දිස්ත්‍රික්කයේ නුවරඑළිය කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ ඒ. බී. ඒ. බෝකොලමුල්ල මහතා 1972. 11. 21 වෙනි දින සිට නැවත නියමයක් කරනතුරු මාතලේ පාලන දිස්ත්‍රික්කයේ මාතලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ පී. බී. වේරගොඩ මහතා 1972. 12. 01 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු සංස්කෘතික කටයුතු පිළිබඳ සහකාර අධ්‍යක්ෂවරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ ඩබ්ලිව්. ඇල්. සී. පෙරේරා මහතා 1972. 12. 01 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ජ්‍යෙෂ්ඨ සහකාර කම්කරු කොමසාරිස් වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ කේ. ඒ. අයි. ද ආබ්‍රේව් මහතා 1972. 12. 01 දින සිට නැවත නියමයක් කරනතුරු සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සහකාර ලේකම් වරයෙකු වශයෙන්.

පී. එච්. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ වැඩ බලන ලේකම්.

1973. 05. 18 දින,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.

6–112—73.06.01 දින අංක 62 දරණ ගැසට් පත්‍රය

# රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය

## 1973 අංක 285

### වැඩ බැලීමේ පත් කිරීම

ශ්‍රේෂ්ඨාධිකරණයේ 4 වැනි නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් එල්. ඒ. සෙනෙවිරත්න මහතා 1973 පෙබරවාරි මස 19 වැනි දින නැවත නියමයක් කරන තුරු ශ්‍රේෂ්ඨාධිකරණයේ 3 වැනි නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් තනතුරෙහි පූර්ණකාලීනව වැඩ බැලීමට අධිකරණ ඇමතිතුමා විසින් පත් කර ඇත.

නිහාල් ජයවික්‍රම,
අධිකරණ ලේකම්.

1973. 05. 23 දින,
කොළඹ 12, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

6–132—73.06.01 දින අංක 62 දරන ගැසට් පත්‍රය

## 1973 අංක 286

### වැඩ බැලීමේ පත්වීම

අධිකරණ ඇමතිතුමා විසින්, 1973 අප්‍රේල් මස 09 දින සිට ශ්‍රේෂ්ඨාධිකරණයේ 4 වැනි නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් තනතුරේ වැඩ බැලීමට, ශ්‍රේෂ්ඨාධිකරණ ලඝු ලේඛක සේවයේ, ඉහල ශ්‍රේණියේ ලඝු ලේඛක ඈන්තනි පෙරේරා මහතා පත් කොට ඇත.

නිහාල් ජයවික්‍රම,
අධිකරණ ලේකම්.

1973. 05. 23 දින,
කොළඹ 12,
අධිකරණ අමාත්‍යාංශයේ දීය.

6–131—73.06.01 දින අංක 62 දරණ ගැසට් පත්‍රය

# ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී.—බී 212/32

### මෝටර් රථ (සම්මුති) ආඥපනත

(204 වැනි අධිකාරය වන) මෝටර් රථ (සම්මුති) ආඥා පනතේ 2 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ප්‍රවාහණ ඇමතිවරයා විසින් සම්පාදනය කරනු ලැබ, ජාතික රාජ්‍ය සභාව මගින් අනුමත කරන ලද නියෝගය.

ලෙස්ලි ගුණවර්ධන,
ප්‍රවාහණ ඇමති,

1973 මැයි මස 14 දින,
කොළඹ.

### නියෝගය

1958 නොවැම්බර් 28 වැනි දින අංක 11,603 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද 1958 මෝටර් වාහන පිළිබඳ ජාත්‍යන්තර ධාවන නියෝග එහි වූ 16 වැනි නියෝගයේ " රු. 5.00 යන යෙදුම වෙනුවට රු. 10.00 " යන යෙදුම ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

6–116—73.06.01 දින අංක 62 දරණ ගැසට් පත්‍රය

එල්.ඩී.—බී 8/72

### 1971 අංක 27 දරන රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගම් (නීතිගත කිරීමේ) පනත

1971 අංක 27 දරන රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගම් (නීතිගත කිරීමේ) පනතේ 10 වැනි වගන්තිය යටතේ රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමය විසින් සාදනු ලැබ, ඒ වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් අමාත්‍යවරයා විසින් ස්ථිර කරන ලද රීති,

සී. ඒ. කුරේ,
මුදල් අමාත්‍යාංශයේ ලේකම්.

1973 මැයි මස 19 දින,
කොළඹ දීය.

රීති

1 වන පරිච්ඡේදය—පොදු

*සාමාජිකත්වය*

1. (1) විශ්‍රාම වැටුප් සහිත තනතුරුවල ස්ථිර කරනු ලැබූ හෝ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවන ස්ථිර තනතුරු දරණ වයස අවුරුදු 35 ට නොවැඩි රාජ්‍ය නිලධාරීන් සහ පළාත් පාලන සේවයේ නිලධාරීන්, පාලක කාරක සභාවේ අභිමත පරිදි මෙම සංගමයේ සාමාජිකත්වය ලැබීමට සුදුස්සෝ වෙති: එසේ වුවද,

(අ) 1946. 4. 1 දිනට හෝ ඊට පසුව තමාගේ විශ්‍රාම වැටුප් සහිත තනතුර දැරීම අවසන් කළ නොහොත් අවසන් කරන සාමාජිකයකු එසේ ස්ථිර තනතුර දැරීම අවසන් වූ දින සිට අවුරුදු දෙකක කාල සීමාවක් ගත වී යාමට පෙර විශ්‍රාම වැටුප් පදනම පිට රාජ්‍ය සේවයේ හෝ පළාත් පාලන සේවයේ තනතුරක් පිළිගත්තේ නම් හෝ පිළිගනිත් නම් සංගමයට අයවිය යුතු හිඟ මුදල් ගෙවීමෙන් පසුව ඒ සාමාජිකයා විසින් සිය සාමාජිකත්වය පාලක කාරක සභාවේ අභිමතය පරිදි නැවතත් ලබා ගත හැකිය.

(ආ) රාජ්‍ය සේවයේ හෝ පළාත් පාලන සේවයෙන් බාහිර වූ තනතුරකට මාරු කරනු ලැබූ හෝ ද්විතීයනය කරනු ලැබූ සාමාජිකයකු තවදුරටත් සාමාජිකත්වයේ රැඳී සිටීමට සුදුසු වන්නේය.

(ඇ) විශ්‍රාම වැටුපකට හෝ ප්‍රදානයකට අයිතිවාසිකම් ඇතිව වෙනත් තනතුරක් සඳහා මුදා හරිනු ලැබූ සාමාජිකයෙකුට සාමාජිකත්වයේ තවදුරටත් රැඳී සිටීමේ අයිතිවාසිකම ලැබේ. එවැනි සාමාජිකයකුගේ සාමාජිකත්වය අවසන් වනුයේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ප්‍රදානයක් ගෙවන ලද විටක හෝ සේවයෙන් පහකළ විටක හෝ ගෙවීම් පැහැර හැරිය විටක පමණි.

(ඈ) (i) දිවයිනෙන් බැහැර වී සිටීම (ii) සේවය නතර කරනු ලැබීම හෝ (iii) වෛද්‍ය නිවාඩු පිට, අධ්‍යයන නිවාඩු පිට හෝ එසේ නැත්නම් වැඩ තහනම් කරනු ලැබ සිටීමේ ප්‍රතිඵලයක් වශයෙන් අඩු වැටුපක් ලැබීම නිසා තම සාමාජිකත්වය අවසන් වූ සාමාජිකයකු විසින්, තම සාමාජිකත්වය පාලක කාරක සභාවේ අභිමතය පරිදි නැවතත් ලබාගත හැකිය.

(1) එසේ වුවද ඔහු දිවයිනට ආපසු පැමිණි දින සිට හෝ ඔහුගේ වෛද්‍ය නිවාඩු නැත්නම් අධ්‍යයන නිවාඩු අවසන් වූ දින සිට හෝ එසේත් නැත්නම් ඔහු නැවත සේවයට පත් කරනු ලැබූ දින සිට තෙමසක කාලයක් ඇතුළතදී මෙන්ම සාමාජිකත්වය අවසන් වූ දින සිට අවුරුදු පහක කාලයක් ගත වීමට පෙර ද එකී සාමාජිකයා විසින් සාමාජිකත්වය සඳහා අයදුම් පතක් ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(2) අඛණ්ඩතාවයක් නොමැතිව සාමාජිකත්වය දරුවකු ලෙසින් සැලකුණි නම් ඔහු විසින් සංගමයට ගෙවීමට නියමිත වූ සියලුම මුදල් පාලක කාරක සභාව පැන වූ නියමිත දිනයේ හෝ ඊට කලින් එකී සාමාජිකයා ගෙවිය යුතුය.

(2) ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවල ආධුනික ස්ථිර කරනු නොලැබූ නමුත් ඒ තනතුරුවල කාලය ගෙවන නිලධාරීන් පාලක කාරක සභාවේ අභිමතය පරිදි සාමාජිකත්වයට බඳවා ගනු ලැබිය හැකිය.

*සාමාජිකයන් බඳවා ගැනීම.*

2. (1) ඉදිරිපත් කරනු ලබන බඳවා ගැනීමේ ඉල්ලුම් පත්‍ර, පාලක කාරක සභාව විසින් කලින් කල අනුමත කරනු ලබන ආකෘතියක විය යුතුය. ඒ ඉල්ලුම් පත්‍රයන් සම්බන්ධයෙන් පාලක කාරක සභාවේ තීරණය අවසන් තීරණය අවසානාත්මක වන්නේය. ඒ ඉල්ලුම් පත්‍රයක් ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවකදී ඒ ගැන හේතු දැක්වීම අනවශ්‍ය වන්නේය.

(2) අයදුම්කරුගේ වෛද්‍ය රපෝර්තුව කාර්යාලයට ලැබුණු මාසයේ පළමුවන දිනට පෙරාතුව නොවන දිනයක සාමාජිකත්වය ආරම්භ විය යුතුය. ඉල්ලුම් පත්‍රය නිසි ලෙස අනුමත කරනු ලැබූ පසු පමණක් සාමාජිකත්වය දිය යුතුය.

(3) ස්වකීය ඉල්ලුම් පත්‍රයේ අසත්‍ය ප්‍රකාශයක් කරනි යම් සාමාජිකයකු, ඒ ප්‍රකාශය වුවමනාවෙන්ම කරන ලද්දක් නොවන බවට පාලක කාරක සභාව සෑහීමට පත් කළහොත් මිස, ඔහු විසින් සංගමයට ගෙවන ලද සියලුම මුදල් ද සාමාජිකයෙකු වශයෙන් දිනාගත් වරප්‍රසාදයන් ද ඔහුට අහිමි වන්නේය.

(4) සාමාජිකත්වය පතන සෑම අයදුම්කරුවකු ම තමාගේ වියදමින් රජයේ වෛද්‍ය නිලධාරියකු හෝ විශ්‍රාම ලත් රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට භාජන විය යුතු ය. වෛද්‍ය නිලධාරියා ඉදිරිපත් කරන වාර්තා ව අනුමත කරන ලද ආකෘතියේ විය යුතුය.

(5) පත්වීම ලැබී තුන් අවුරුද්දක් ඇතුළත ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් පත්‍රයන් සමග, අයදුම්කරු ශාරීරිකව සුදුසු බව රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් සහතික කරනු ලැබූ බවට දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ සහතිකයක් ඉදිරිපත් කරනු ලබන්නේ නම් වෛද්‍ය වාර්තාවක් අනවශ්‍ය ය.

*ගාස්තු.*

3. (අ) සාමාජිකත්වය ඉල්ලා සිටින සෑම අයදුම්කරුවෙක්ම රුපියල් පහක ඇතුලත්වීමේ ගාස්තුවක් ගෙවිය යුතුය. එම මුදල සාමාජිකත්වය ලැබූ පළමුවැනි මාසයේ පඩිපතින් අයකර ගනු ලැබිය යුතු ය.

*1953 ට පූර්ව අලාභ ක්‍රමක්ෂය ගාස්තුව.*

(ආ) 1953 ට පූර්ව අලාභ ක්‍රමක්ෂය ගාස්තුවක් වශයෙන්, රුපියල් හතරක ආපසු නොගෙවනු ලබන මුදලක් සෑම සාමාජිකයකුගෙන්ම අය කර ගත යුතු අතර එය සෑම අවුරුද්දකම මාර්තු සහ දෙසැම්බර් මාසවලදී රුපියල් දෙක බැගින් වූ කොටස් දෙකකින් අයකර ගත යුතුය.

*පාලක කාරක සභාව.*

4. (1) සංගමයේ කාර්ය පරිපාලනය සෑම අවුරුද්දකම වාර්ෂික මහා සභාරැස්වීමේ දී තෝරා පත්කර ගනු ලබන්නාවූද, කොළඹ රැකියාවෙහි නියුතු වූද සභාපති වරයෙකුගෙන් ද උප සභාපතිවරුන් දෙදෙනෙකුගෙන් සහ තවත් සාමාජිකයන් දොළොස් දෙදෙනෙකුගෙන් සහ මුදල් විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන එක් රාජ්‍ය නිලධාරියකුගෙන් ද සමන්විත වූ පාලක කාරක සභාවක් මගින් කරනු ලැබිය යුතුය.

(2) ඉහත (1) වන උප රීතියෙහි සඳහන් පාලක කාරක සභාවේ නිලතල වලටත් කාරක සභිකත්වයටත් තෝරා පත් කිරීම සඳහා එවන නාම යෝජනා, අපේක්ෂකයාගේ කැමැත්ත පිළිබඳ සටහන සමග යෝජක ස්ථිර යන දෙදෙනා විසින් නිසි පරිදි අත්සන් කරනු ලැබ හා ඔවුන්ගේ සාමාජික අංකයන් ද සඳහන් කරනු ලැබ වාර්ෂික මහා සභා රැස්වීමේ පූර්ව නිවේදනයෙහි නියම් කොට ඇති දින හෝ ඊට කලින් ලේකම් සහ ගණකාධිකාරීවරයා වෙත එවනු ලැබිය යුතුය. පාලක කාරක සභාව විසින් සියලුම නාම යෝජනා පත්‍ර සෝදිසි කර, නියමතාවයනට අනුව නාමයෝජනා ඉදිරිපත් කැරුණු අපේක්ෂකයන්ගේ සම්පූර්ණ ලැයිස්තුවක් ඒ ඒ යෝජක සහ ස්ථිරකයන්ගේ නම් ද සමග න්‍යාය පත්‍රය හා ප්‍රසිද්ධ කරනු ලැබිය යුතුය.

*සම්මාන මුදල.*

5. (1) සභාපතිවරයාට ගෙවිය යුතු වාර්ෂික සම්මාන මුදල රුපියල් එක්දස් දෙසියයක් විය යුතුය.

(2) සංගමයේ භාරකරුවන් විය යුත්තේ සභාපතිවරයා, උප සභාපති වරුන් දෙදෙන සහ ලේකම් හා ගණකාධිකාරී වරයාත් ය.

*පාලක කාරක සභාවේ බලතල.*

6. (1) නිලධාරීන් අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීම සහ සේවයෙන් පහ කිරීම සම්බන්ධ කටයුතු පිළිබඳවත් සංගමයේ කාර්ය පරිපාලනය පිළිබඳවත්, එහි අරමුණ සාධනය පිළිබඳවත්, එබඳු පත්වීම් සහ පරිපාලන කටයුතු සඳහා අවශ්‍ය වන මුදල් සංගමයේ අරමුදල් වලින් වියදම් කිරීම පිළිබඳවත් සියලුම කටයුතු පාලනය කිරීමේ, මෙහෙයවීමේ හා තීරණය කිරීමේ සම්පූර්ණ බලය හා අධිකාරිය පාලක කාරක සභාව සතු වන්නේය.

(2) ලිපිකාර කාර්ය මණ්ඩලයට බඳවාගනු ලබන්නේ නම් රුපියල් දෙදහසකට නොඅඩු වූද, සුළු සේවක මණ්ඩලයට බඳවා ගනු ලබන්නේනම් රුපියල් පන්සියයකට නොඅඩුවූ ද මුදල් ඇපයක් පාලක කාරක සභාව විසින් කලින් කල නියම කරනු ලබන ආකාරයකට තබන ලෙස, පාලක කාරක සභාව විසින් ස්ථිර කාර්ය මණ්ඩලයට බඳවා ගනු ලබන සියළුම තැනැත්තන්ට, එම කාරක සභාව විසින් නියම කළ යුතු ය.

**කාරක සභා රැස්වීම.**

7. (1) සංගමයේ කටයුතු කරගෙන යාම සඳහා පාලක කාරක සභාවේ රැස්වීම් සෑම මසකම යටත් පිරිසෙයින් එක් වරක්වත් කැඳවනු ලැබිය යුතු අතර පාලක කාරක සභාවේ විශේෂ රැස්වීම, ඒ රැස්වීම් කැඳවන දැන්වීමේ සඳහන් කරනු ලබන කටයුතු ඉටු කිරීම සඳහා සභාපති විසින් ස්වකීය අභිමතය පරිදි කැඳවනු ලැබිය හැක. කාරක සභිකයින් අට දෙනකුට නොඅඩු ගණනක් විසින් ඉල්ලීමක් කරනු ලැබූ කවර අවස්ථාවකදී වුවද ඒ ඉල්ලීමේ සඳහන් කරනු ලබන කටයුතු ඉටු කිරීම සඳහා කාරක සභාවේ විශේෂ රැස්වීමක් සභාපති විසින් කැඳවනු ලැබිය යුතුය.

(2) පාලක කාරක සභාවේ රැස්වීමක් සඳහා අවශ්‍ය ගණ පූරණය සාමාජිකයන් පස් දෙනෙකු වේ.

**කාරක සභාවේ රැස්වීම්වලට පැමිණීම.**

8. (1) නොපැමිණෙන බව සහ ඊට හේතුන් ලිඛිත දැන්වීමකින් පාලක කාරක සභාවට කලින් නොදන්වා පාලක කාරක සභාවේ අනුගාමී රැස්වීම් තුනකට නොපැමිණෙන කාරක සභිකයකුගේ කාරක සභා සාමාජිකත්වය ඒ හේතුව නිසාම අවසන් වන්නේ ය.

**පාලක කාරක සභාවේ පුරප්පාඩු.**

(2) පාලක කාරක සභාවේ පුරප්පාඩුවක් ඇති වූ කල ඒ පුරප්පාඩුව සඳහා සාමාජික ලැයිස්තුවේ ඇතුළත් තැනැත්තකු 4 (II) වන රීතිය අනුව කරන තෝරා පත්කර ගැනීමක මාර්ගයෙන් පත්කර ගැනීම පාලක කාරක සභාව විසින් කළ යුතුය.

**මුදල් වර්ෂය.**

9. සංගමයේ මුදල් වර්ෂය එක් එක් වර්ෂයේ ජනවාරි 1 වැනි දිනයෙන් පටන් ගන්නා දොළොස් මසක කාල පරිච්ඡේදය විය යුතුය.

**විගණකවරු.**

10. විගණකවරුන් තෝරා පත් කර ගැනීම හා ඔවුන්ගේ පාරිශ්‍රමිකය නිගමනය කිරීම වාර්ෂික මහා සභා රැස්වීමේදී කරනු ලැබිය යුතු ය. එක් එක් වර්ෂය සඳහා විගණන වැඩ පිළිවෙළ විගණකවරුන් විසින් සකස් කරනු ලැබිය යුතු අතර එය පාලක කාරක සභාව විසින් අනුමත කරනු ලැබිය යුතු ය.

**වාර්ෂික මහා සභා රැස්වීම.**

11. (1) සංගමයේ මහා සභා රැස්වීම එක් එක් අවුරුද්දේ ජූනි මස 30 වැනි දිනට පසු නොවන දිනයක එම රැස්වීම කැඳවීම පිළිබඳ නිවේදනයේ සඳහන් කරනු ලබන ස්ථානයක හා වේලාවක පවත්වනු ලැබිය යුතු ය.

(2) ඉකුත් මුදල් වර්ෂය තුළ සංගමයේ වැඩ කටයුතු පිළිබඳ වාර්තාවක් සහ ලේකම් හා ගණකාධිකාරී විසින් සකස් කරනු ලැබ සංගමයේ විගනකවරුන් විසින් නිසි පරිදි විගණනය කළ සහතික කරනු ලැබූ—

(අ) ලැබීම් සහ ගෙවීම් ගිණුම,
(ආ) ආදායම් සහ වියදම් ගිණුම,
(ඇ) විශ්‍රාම දීමනා අරමුදල් ගිණුම,
(ඈ) මරණ පරිත්‍යාග ගිණුම,
(ඉ) ඉතිරි කිරීමේ ක්‍රම ගිණුම, සහ
(ඊ) ශේෂ පත්‍රය ද

ඒ වාර්ෂික මහා සභා රැස්වීමේදී පාලක කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

**විශේෂ මහා සභා රැස්වීම.**

12. (1) සංගමයේ විශේෂ මහා සභා රැස්වීම්—

(අ) කාරක සභාව විසින් අවශ්‍යයැයි සලකන විට,
(ආ) 50 දෙනෙකුට අඩු නොවන සාමාජික සංඛ්‍යාවකගේ ලිඛිත ඉල්ලීමක් පිට හෝ
(ඇ) සභාපතිවරයා විසින් අවශ්‍යයැයි සළකන විට කැඳවනු ලැබිය හැකිය.

(2) විශේෂ මහා සභා රැස්වීමක් කැඳවන සෑම ඉල්ලීමකම නැතහොත් නිවේදනයකම රැස්වීමේ කාර්යය කුමක්දැයි නිශ්චිතව සඳහන් විය යුතුය.

**මහා සභා රැස්වීම් පිළිබඳ නිවේදනය.**

13. (1) යටත් පිරිසෙයින් එක් දේශීය දිනපතා ප්‍රවෘත්ති පත්‍රයකවත් පළ කරනු ලබන දැන්වීමක මාර්ගයෙන්, සෑම මහා සභා රැස්වීමක් ගැනම දින 14 කට (දහ හතරකට) නො අඩු දැනුම් දීමක් කළ යුතු යි.

(2) මහා සභා රැස්වීමේදී ඉදිරිපත් කරනු වස් නිසි ලෙස යෝජනාකොට ස්ථිර කර ගත් යෝජනාවක් ද රීතීන් පිළිබඳ සංශෝධන ද රැස්වීම් කැඳවන නිවේදනයේ නියමිත දින හෝ ඊට පෙර ලේකම් හා ගණකාධිකාරී වෙත ලැබෙන්න සැලැස් විය යුතුය.

**මහා සභා රැස්වීමේ ගණ පූරණය.**

14. 11 වැනි සහ 12 වැනි රීතීන් යටතේ මහා සභා රැස්වීමකට අවශ්‍ය ගණපූරණය සාමාජිකයින් තිස් දෙනෙකි.

15. වෙනත් ලෙසකින් තීරණය කරනු ලැබුවහොත් මිස සෑම විටකම මහා සභා රැස්වීමක ඡන්දය ප්‍රකාශ කළ යුත්තේ අත් එසවීමකිනි. ඡන්ද ගණන සමාන වූ අවස්ථාවක තීරක ඡන්දයක් ප්‍රකාශ කිරීමේ අයිතිය සභාපතිවරයාට ඇත.

**සභාවේ මූලසුන.**

16. සංගමයේ සියලුම රැස්වීම්වල මූලාසනය සභාපතිවරයා විසින් දැරිය යුතු ය. සභාපතිවරයා නොපැමිණි අවස්ථාවක පැමිණ සිටින අය විසින් උප සභාපතිවරුන් දෙදෙනා අතුරින් නිසි පරිදි තෝරාගනු ලැබූ කෙනෙකු එම රැස්වීමේ සභාපති විය යුතු ය.

**මුදල් භාරය.**

17. (1) සංගමයට අය වන සියලුම මුදල් භාර ගැනීමත් ඒ සම්බන්ධ ගිණුම් තැබීමත් ලේකම් හා ගණකාධිකාරී විසින් කළ යුතු ය. පාලක කාරක සභාවේ අනුමැතිය පරිදි එම මුදල් සංගමයේ නමින් ස්වදේශීය බැංකුවක හෝ බැංකු කීපයක තැන්පත් කළ යුතුවේ. ලේකම් හා ගණකාධිකාරීවරයාගේ හෝ ලේකම් හා ගණකාධිකාරීවරයා වෙනුවට වැඩ බැලීම සඳහා පාලක කාරක සභාව විසින් නිසි පරිදි පත්කරනු ලැබූ වෙනත් නිලධාරියකුගේ සහ සභාපතිවරයාගේ නැතහොත් උප සභාපතිවරුන් දෙදෙනාගෙන් කෙනෙකුගේ අත්සන් බැංකුව විසින් පිළිගත යුතු වේ.

(2) සංගමයේ අතිරික්ත මුදල් පාලක කාරක සභාව විසින් ස්වකීය අභිමතය පරිදි ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සහ/හෝ වාණිජ බැංකුවල ස්ථිර තැන්පතු වශයෙන් සහ/හෝ මෙම රීතිවලින් නියමිත ආකාරයට සාමාජිකයන්ට දෙනු ලබන ණය මුදල් වශයෙන් ආයෝජනය කළ හැකි ය.

**පවත්වා ගත යුතු පොත්.**

18. සාමාජික ලේඛනය, මුදල් පොත, ජර්නලය, ලැජරය, වාර්තා පොත සහ සංගමයේ වැඩ කරගෙන යාම සඳහා අවශ්‍ය විය හැකි සෙසු සියලුම පොත් ද ලේකම් හා ගණකාධිකාරීවරයා විසින් පවත්වා ගෙන යා යුතු ය.

**පොත් පිරික්සුම.**

19. ලේකම් හා ගණකාධිකාරීවරයාට සත් දිනක ලිඛිත දැනුම් දීමක් කිරීමෙන් පසුව, සංගමයේ පොත් හා ගණන් ගිලව් කවර හෝ සාමාජිකයකු විසින් කාර්යාල වේලාවන් තුළ දී පරීක්ෂා කළ හැකි ය.

**රීති වෙනස් කිරීම ආදිය.**

20. මහා සභා රැස්වීමක දී පැමිණ සිටින හා ඡන්දය ප්‍රකාශ කරන සාමාජිකයන් ගණනින් යටත් පිරිසෙයින් තුනෙන් දෙකොටසකගේ වත් ඡන්දය ලැබ කරනු ලැබූවක් නම් මිස, අනුමතිය ඇතිව විනා සංගමයේ රීතිවල කිසිදු වෙනසක් හෝ සංශෝධනයක් හෝ කිසිදු රීතියක් ඉවත් කිරීමක් හෝ ඒවාට කරන කිසිම එකතු කිරීමක් වලංගු නොවේ.

**විශ්‍රාම දීමනා සංචිතය.**

21. (1) වියදමට වඩා ඇත්තා වූ ආදායම අතිරික්තය අවුරුදු පතා විශ්‍රාම දීමනා සංචිතයට මාරු කරනු ලැබිය යුතු ය.

(2) ආදායම් හා වියදම් ගිණුමේ කිසියම් අඩුවක් හෝ සාමාජිකත්වය නිමවීම හේතුකොට ගෙන ඇතිවී ඉකුත් අවුරුදුවල ගිණුම් වලින් මුදල් වෙන් කරනු නොලැබූ බැරකම් ද මෙම සංචිතයෙන් පියවිය යුතු ය.

**පොදු සංචිතය.**

22. (1) 21 වැනි රීතියෙහි ඇතුළත් කිසිවක් නොසලකා විශ්‍රාම දීමනා සංචිතයෙන් රුපියල් පන්දාහක් මාරු කිරීමෙන් පොදු සංචිතය 1965 ගිණුම තුළ ආරම්භ කළ යුතු ය. ඊට අතිරේකව විශ්‍රාම දීමනා සංචිතය වෙත මාරු කිරීමට පෙර අතිරික්ත ආදායමෙන් වෙන්කර ගත් රුපියල් දෙදාහක මුදලක් 1965 අවුරුද්දෙන් පටන් ගෙන අවුරුදු පතා මෙම සංචිතයට බැර කරනු ලැබිය යුතු ය. සියලුම වියදම්, ඉකුත් අවුරුදුවල බැරකම් සහ ගෙවීම සුදුසු යයි පාලක කාරක සභාව විසින් සලකනු ලබන වෙනත් කිසියම් වැය බරක් ද මෙම සංචිතයෙන් පියවිය යුතු ය.

**ගොඩනැගිලි සංචිතය.**

(2) ගොඩනැගිලි සංචිතයක්, 1972 ගිණුම්වල ඇති කොට විශ්‍රාම දීමනා සංචිතයට මාරු කිරීමට පෙර වර්ෂයක් පාස ඇති අතිරික්ත ආදායමෙන් තුනෙන් පංගුවක් ප්‍රතිපාදනය කොට බැර කිරීමෙන් ගොඩ නගනු ලැබිය යුතුය.

**ගණන් පියවා වසා දැමීම.**

23. නාම ලේඛනයේ දැක්වෙන සාමාජික සංඛ්‍යාවෙන් යටත් පිරිසෙයින් තුනෙන් දෙකකගේවත් කැමැත්ත නොලබා මෙම සංගමය ගණන් බේරා වසා දැමීම නො කළ යුතුය. ගණන් බේරා වසා දැමීමේ අවස්ථාවේදී, හිමිකම් පෑම් සියල්ල පියවා ශුද්ධ පසු සංගමයේ අරමුදල් එක් එක් සාමාජිකයා දායක මුදල් හැටියට සහ/හෝ මරණ පරිත්‍යාග හැටියට ස්වකීය සාමාජික කාලය ඇතුළත ගෙවූ මුදල් ප්‍රමාණයට අනුපාතිකව සාමාජිකයන් අතර බෙදා දිය යුතු ය.

**විධිවිධාන සලස්වනු නොලැබූ කරුණු.**

24. සංගමයේ රීතිවල විධිවිධාන සලස්වනු නොලැබූ යම් කරුණක් සම්බන්ධයෙන්, පාලක කාරක සභාවේ යෝජනා සම්මතයක මාර්ගයෙන් ක්‍රියා කළ හැකිය. ස්ථිර කිරීම සඳහා එම යෝජනා සම්මතය මහා සභා රැස්වීමට ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

**අර්ථ නිරූපණය.**

25. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම රීති මාලාවේ "සංගමය" යන්නෙන් "රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමය" අදහස් වේ. "සේවය" යන්නෙන් රාජ්‍ය සේවය හෝ පළාත් පාලන සේවය අදහස් වේ.

## II වන පරිච්ඡේදය

### දායක මුදල් සහ දීමනා

**දායක මුදල්.**

26. (1) සෑම සාමාජිකයෙකුම මාස් පතා රුපියල් අටක් බැගින් ගෙවිය යුතුය. ඉන් රුපියල් හතක් විශ්‍රාම සුභ සාධනය සඳහා වන අතර, රුපියලක් මරණ අය කිරීම සඳහා වේ. මුළු මුදල සෑම මසකම අවසානයේ දී ගෙවිය යුතුය. මේ මුදල පඩි පතින් කපාගනු ලැබේ. ලේකම් හා ගණකාධිකාරී වෙත මෙම මුදල මාස් පතා යවන බවට වග බලා ගැනීම සඳහා අවශ්‍ය පියවර සෑම සාමාජිකයකු විසින්ම ගනු ලැබිය යුතුය.

(2) 1963. 4. 1 වැනි දිනට සාමාජිකත්වය දරමින් සිටි සියලුම තැනැත්තන්ට සහ ඉනික්බිතිව සාමාජිකත්වය ලබා ගත් සියලුම තැනැත්තන්ට මෙම ගාස්තු ප්‍රමාණයන්, අතීත බලපෑම ඇතිව 1953. 1. 1 වැනි දින සිට අදාළ වේ.

**පාස් පොත.**

27. සෑම සාමාජිකයකුටම පාස් පොතක් දෙනු ලැබේ. එම පාස් පොත ලේකම් හා ගණකාධිකාරීවරයා වෙත සෑම හයමසකටම වරක් යැවූ විට, ලැජරයේ දැක්වෙන පරිදි ඔහුගේ ගිණුම එහි සටහන් කරනු ලැබිය යුතු ය.

**හිමිකම් පෑම් පියවීම.**

28. (1) සාමාජිකයකුගේ සාමාජිකත්වය අවසන්වීම, ඔහු සේවයෙන් පහ කරනු ලැබීම හෝ ඔහුගේ සේවය නැවැත්වීම හෝ ඔහු සේවයෙන් ඉල්ලා අස්වීම සිදුවූ අවස්ථාවකදී, සංගමය වෙත අයවිය යුතු මුදලක් වෙතොත් එය අඩු කරගත් පසුව සාමාජිකයාගේ නමින් බැරට තිබෙන මුදල, එය සාමාජිකත්වය නිමවීමෙන්, විශ්‍රාම ගැනීමෙන්, සේවයෙන් පහ කරනු ලැබීමෙන්, සේවය නැවැත්වීමෙන් හෝ සේවයෙන් ඉල්ලා අස්වීමෙන් තුන් මසක් ඇතුළත ඔහුට ගෙවනු ලැබිය යුතුය.

(2) එවැනි සාමාජිකයකුගේ මරණය සිදුවූ අවස්ථාවක දී, ඔහුට ගෙවීමට නියමිතව ඇති මුදල ඔහුගේ යෝජිතයාට ගෙවිය යුතුය. යෝජිතයකු නොමැති විට, ඔහුගේ පාලනය කළ යුතු බූදලයක් ඇත්නම් එම බූදලයටද එසේ නොමැත්තේ නම් නීත්‍යානුකූල උරුමක්කාරයන්ටද ගෙවිය යුතු ය.

(3) සාමාජිකයකුගේ සාමාජිකත්වය අවසන් වීම, ඔහු විශ්‍රාම ගිය, සේවයෙන් පහ කරනු ලැබූ, ඔහුගේ සේවය නවත්වනු ලැබූ හෝ ඔහු සේවයෙන් ඉල්ලා අස්වූ දිනය ලෙස සැලකෙන දිනයේ සිට හෝ ඔහුගේ වයස අවුරුදු 60 සම්පූර්ණ වූ දිනයේ සිට ක්‍රියාත්මක විය යුතු ය.

29. සාමාජිකත්වය අවසන්වීම නිසා සාමාජිකයන්හට ගෙවිය යුතුව පවතින මුදල්, පවතින ණයක් හැටියට සාමාජිකත්වය නිම වූ ලිත් වර්ෂයේ සිට අවුරුදු තුනක් ඉකුත් වන තුරු ගිණුමෙහි දක්වනු ලැබිය යුතුය. ඉනික්බිතිව ඒ මුදල් පොදු සංචිතය වෙත මාරු කරනු ලැබිය යුතු අතර එයින් කෙරෙන ගෙවීම්වල විස්තර වාර්ෂික ගිණුම්වල දැක්විය යුතු ය.

**විශ්‍රාම යෑමේදී සිදු කෙරෙන දීමනාව.**

30. විශ්‍රාම සුභ සාධක ක්‍රමය වෙත දායක මුදල් ගෙවූ සෑම සාමාජිකයකුටම, ඔහු සේවයෙන් විශ්‍රාම ගිය වහාම, ඔහුගේ සේවය අවසන් කරනු ලැබූ වහාම හෝ ඔහු සේවයෙන් පහ කරනු ලැබූ වහාම නැත්නම් සේවයෙන් ඉල්ලා අස්වූ වහාම, පහත සඳහන් ගෙවීම් කරනු ලැබිය යුතු ය.

(i) විශ්‍රාම සුභ සාධකය වෙනුවෙන් ඔහු විසින් ගෙවා ඇති මුළු මුදල සහ

(ii) සාමාජිකත්වය සම්පූර්ණ කරගත් එක් එක් වර්ෂය සඳහා විශ්‍රාම සුභ සාධකය වෙනුවෙන් ඔහු විසින් ගෙවා ඇති මුළු මුදලින් හැටෙන් පංගුව බැගින් වූ දීමනාවක් සහ සාමාජිකත්වය දැරූ අවසාන මාසය දක්වා අනුපාතික වශයෙන් ගණන් බලන ලද ප්‍රදාන මුදලක්.

1953. 1. 1 දිනට පෙර කිසියම් සාමාජිකයකු විසින් ගෙවා ඇති මුදල, 1953. 1. 1 දින දක්වා වූ සාමාජිකත්වයේ එක් එක් මාසය වෙනුවෙන් කැපෙන රුපියලක මරණ අය කිරීමක් අඩු කිරීමෙන් පසුව නිගමනය කරනු ලැබිය යුතු අතර එසේ අඩු කිරීමෙන් පසු ඉතිරි වන මුදල පමණක් විශ්‍රාම සුභ සාධනය වෙත ගෙවූ දායක මුදල හැටියට ගණන් ගනු ලැබිය යුතු ය.

සේවයේ නියුතුව සිටියදී සිදුවන මරණ

31. " සාමාජිකයෙකුගේ අභාවයේ දී, එම සාමාජිකයාගේ යෝජිතයාට/යෝජිතයන්ට හෝ යෝජිතයකු නොමැති නම් එම සාමාජිකයාගේ නීත්‍යානුකූල උරුමක්කාරයින් හට, පහත සාමාජිකයා සංගමයට බැඳුනු වයස අනුව දැක්වෙන පරිදි දීමනාවක් ගෙවනු ලැබිය යුතු ය:—

| සේවයට බැඳුනු වයස | | | | ගෙවිය යුතු ගණන |
|---|---|---|---|---|
| | | | | රුපියල් |
| අවුරුදු 20 සහ ඊට අඩු | ... | ... | ... | 4,500 |
| අවුරුදු 20 ට වැඩිව අවුරුදු 21 දක්වා | ... | ... | ... | 4,400 |
| අවුරුදු 21 ට වැඩිව අවුරුදු 22 දක්වා | ... | ... | ... | 4,300 |
| අවුරුදු 22 ට වැඩිව අවුරුදු 23 දක්වා | ... | ... | ... | 4,200 |
| අවුරුදු 23 ට වැඩිව අවුරුදු 24 දක්වා | ... | ... | ... | 4,100 |
| අවුරුදු 24 ට වැඩිව අවුරුදු 25 දක්වා | ... | ... | ... | 4,000 |
| අවුරුදු 25 ට වැඩිව අවුරුදු 26 දක්වා | ... | ... | ... | 3,900 |
| අවුරුදු 26 ට වැඩිව අවුරුදු 27 දක්වා | ... | ... | ... | 3,800 |
| අවුරුදු 27 ට වැඩිව අවුරුදු 28 දක්වා | ... | ... | ... | 3,700 |
| අවුරුදු 28 ට වැඩිව අවුරුදු 29 දක්වා | ... | ... | ... | 3,600 |
| අවුරුදු 29 ට වැඩිව අවුරුදු 30 දක්වා | ... | ... | ... | 3,500 |
| අවුරුදු 30 ට වැඩිව අවුරුදු 31 දක්වා | ... | ... | ... | 3,400 |
| අවුරුදු 31 ට වැඩිව අවුරුදු 32 දක්වා | ... | ... | ... | 3,300 |
| අවුරුදු 32 ට වැඩිව අවුරුදු 33 දක්වා | ... | ... | ... | 3,200 |
| අවුරුදු 33 ට වැඩිව අවුරුදු 34 දක්වා | ... | ... | ... | 3,100 |
| අවුරුදු 34 ට වැඩිව අවුරුදු 35 දක්වා | ... | ... | ... | 3,000 |
| අවුරුදු 35 ට වැඩිව අවුරුදු 36 දක්වා | ... | ... | ... | 2,900 |
| අවුරුදු 36 ට වැඩිව අවුරුදු 37 දක්වා | ... | ... | ... | 2,800 |
| අවුරුදු 37 ට වැඩිව අවුරුදු 38 දක්වා | ... | ... | ... | 2,700 |
| අවුරුදු 38 ට වැඩිව අවුරුදු 39 දක්වා | ... | ... | ... | 2,600 |
| අවුරුදු 39 ට වැඩිව අවුරුදු 40 දක්වා | ... | ... | ... | 2,500 |
| අවුරුදු 40 ට වැඩිව අවුරුදු 41 දක්වා | ... | ... | ... | 2,400 |
| අවුරුදු 41 ට වැඩිව අවුරුදු 42 දක්වා | ... | ... | ... | 2,300 |
| අවුරුදු 42 ට වැඩිව අවුරුදු 43 දක්වා | ... | ... | ... | 2,200 |
| අවුරුදු 43 ට වැඩිව අවුරුදු 44 දක්වා | ... | ... | ... | 2,100 |
| අවුරුදු 44 ට වැඩිව අවුරුදු 45 දක්වා | ... | ... | ... | 2,000" |

සාමාජිකත්වයෙන් ඉවත්වීමේදී හා මරණයේදී දයක මුදල් ආපසු ගෙවීම.

32. (1) සාමාජිකත්වයෙන් ඉවත් වූ අවස්ථාවක දී හෝ සේවයේ සිටියදී මිය ගිය අවස්ථාවකදී, සාමාජිකයා විසින් විශ්‍රාම සුභ සාධනය වෙත ගෙවා ඇති දායක මුදල්, අවස්ථෝචිත පරිදි, ඔහුට හෝ ඔහුගේ යෝජිතයාට (යෝජිතයෙකු නැත්නම් ඔහුගේ නීත්‍යානුකූල උරුමක්කාරයින්ට) ගෙවනු ලැබිය යුතු ය.

(2) පැහැර හැරීමේ ප්‍රතිඵලයක් වශයෙන් සාමාජිකත්වය අහිමි වූවෙකු සාමාජිකත්වය නැවත ලබාගැනීමට ඉඩදී ඇති කාලය ඇතුළත සාමාජිකත්වය යළි ලබා නොගතහොත් ඒ සාමාජිකත්වය අහිමිවීම පැහැර හැරීම පටන් ගත් දා සිට සාමාජිකත්වයෙන් ඉවත්වීමක් හැටියට සලකනු ලැබිය යුතු ය.

(3) 1968. 1. 1 දින හෝ ඉන් පසුව සාමාජිකත්වය අවසන් කරන අවස්ථාවන්හිදී ඉහත කී සංශෝධිත රීතිය බල පැවැත්විය යුතු ය.

ගෙවිය යුතු ප්‍රදාන වලින් සංගමයට අය විය යුතු මුදල් ලබා ගැනීම.

33. (අ) සාමාජිකයකුගේ බැරට ඉතිරි වී තිබෙන මුදල්වලින් සංගමයට අය විය යුතු සියලුම ණය මුදල් මෙම රීති යටතේ ලබාගැනීමට සංගමය අපොහොසත් නම් සංගමයට අයවීමට ඇති ඉතිරි මුදල්, සාමාජිකයාට හෝ ඔහුගේ යෝජිතයන්ට හෝ නීත්‍යානුකූල උරුමක්කාරයින්ට හෝ සංගමය විසින් ගෙවිය යුතුව ඇති කවර හෝ මුදලකින් හෝ මුදල්වලින් අය කර ගත යුතු ය.

සිහ 1953 ට පූර්ව අලාභ ක්‍රමක්ෂය, ගාස්තු, අන්තිම හිමිකම් පෑම්වලින් අය කර ගැනීම.

34. සියලුම සාමාජිකයන්ගෙන් අවසාන වශයෙන් අයවිය යුතු මුදල් ගණන් බැලීමේ දී, පහත දැක්වෙන ගාස්තු ප්‍රමාණයන් අය කරගත යුතු ය:—

(අ) 1953. 1. 1 දිනට පෙර සම්පූර්ණ කරන ලද එක් එක් සාමාජික වර්ෂය වෙනුවෙන් රුපියල් තුන බැගින් වූ මුදලක්,

(ආ) 1953.1.1 සිට 1964.1.1 දක්වා සම්පූර්ණ කරන ලද එක් එක් සාමාජික වර්ෂය වෙනුවෙන් රුපියල් හය බැගින් වූ මුදලක්,

(ඇ) 1964.1.1 සිට සාමාජිකත්වය නිමවූ දින දක්වා සම්පූර්ණ කරන ලද එක් එක් සාමාජික වර්ෂය වෙනුවෙන් රුපියල් හය බැගින් වූ මුදලක්,

වර්ෂයකින් කොටසක් සඳහා මුදල අය කිරීමේ දී සාමාජිකත්වය, මාර්තු මාසයේ පැවතියේ නම් රුපියල් දෙකක් හා දෙසැම්බර් මාසයේ පැවතියේ නම් රුපියල් හතරක් ද වශයෙන් අය කර ගත යුතු ය.

(ඈ) 3 (ආ) වැනි රීතිය යටතේ අය කර ගනු ලැබූ මුදල් ගණන් ගත යුතු ය.

නාමිකයකු පත්කිරීම.

35. (1) කිසිම යෝජිතයෙකු නම් කිරීමක් සාමාජිකයාගේ අත්සන ඇතිව යටත් පිරිසෙයින් සාමාජිකයෙකුගේ මරණය සිදුවීමට සම්පූර්ණ මසකටවත් පෙර ලියාපදිංචි කිරීම සඳහා එය ලේකම් හා ගණකාධිකාරිවරයා වෙත ලැබුණේ නම් මිස, වලංගු නොවේ.

(2) නම් කිරීමේදී දක්වා සිටින කොටස් හෝ අනුපාතය අනුව ප්‍රතිලාභ ලැබීම සඳහා එක් යෝජිතයකු හෝ ඊට වැඩි ගණනක් නම් කිරීමේ අයිතිය සාමාජිකයකුට ඇත. එබඳු නම් කිරීමකදී අනුපාතයක් දක්වා නොමැති නම් ගෙවිය යුතු මුදල යෝජිතයන් අතරේ සමාන කොටස් වලින් බෙදා දෙනු ලැබිය යුතු ය.

(3) යම් යෝජිතයකුගේ නම් කිරීමක් අවලංගු කර ඒ වෙනුවට වෙනත් යෝජිතයකු නම් කිරීම සාමාජිකයකු විසින් කවර අවස්ථාවක දී වුවද කළ හැකි ය. එබඳු අවලංගු කිරීමක් සහ/හෝ නම් කිරීමක් සාමාජිකයාගේ මරණයට සම්පූර්ණ මසකට පෙර ලේකම් හා ගණකාධිකාරිවරයා වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය. එසේ නොවන්නේ නම් නිසියාකාර ලේඛනගත වූ නම් කිරීම අනුව ගෙවීම් සිදු කරනු ලැබිය යුතු ය.

**සංගමයට අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැරීම.**

36. (1) පිට පිට මාස හයක් ගෙවීම් පැහැර හරින්නා වූ සාමාජිකයකුට ඔහුගේ සාමාජිකත්වය අහිමි වන අතර සාමාජිකත්වයෙන් ඉවත් වූවකු ලෙස සලකනු ලැබිය යුතු ය. නැවත සාමාජිකත්වය ලබා ගන්නා දින තෙක් සාමාජිකත්වය දැරුවකු ලෙසින් සැළකුණි නම් ගෙවීමට නියමිත සියලුම මුදල්, සාමාජිකත්වය අහිමි වී මාස හයක් ගතවීමට පෙර එවැන්නකු විසින් ගෙවූ අනතුරුව ලිඛිත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළහොත්, ඔහුගේ සාමාජිකත්වය නැවත ලබා දීමේ බලය පාලක කාරක සභාවට ඇත.

(2) පැහැර හැරීම ඇරඹෙන දිනය වනුයේ දයක මුදල අයවීමට නියමිත මාසයේ පළමු වැනි දිනය ය.

**අවමඟුල් වියදම් සඳහා අත්තිකාරම්.**

37. (1) සාමාජිකයකුගේ මරණය ගැන ලියවිල්ලක මාර්ගයෙන් ලේකම් හා ගණකාධිකාරිවරයා වෙත දැනුම් දෙනු ලැබූ විට එම සාමාජිකයාගේ අවමඟුල් වියදම් සඳහා සාමාජිකයා ගේ වැන්දඹුවට හෝ ඔහු විසින් නම් කරනු යෝජිතයන් ගෙන් කෙනෙකුට රුපියල් පන්සියයකට (රු. 500) නොවැඩි මුදලක් ලේකම් හා ගණකාධිකාරි විසින් ගෙවිය හැකි ය. මේ මුදල සංගමය විසින් ඔහු වෙනුවෙන් ගෙවීමට නියමිත මුදල්වලින් අඩු කර ගත යුතු ය.

(2) මෙම මුදල ගෙවිය යුත්තේ එකී සිද්ධිය සාමාජිකයෙකු විසින් හෝ සාමදාන විනිශ්චයකාරයෙකු හෝ ප්‍රදේශයේ ග්‍රාම සේවකයා විසින් ලේකම් හා ගණකාධිකාරිවරයා සෑහීමට පත්වන පරිදි සනාථ කරනු ලැබුවහොත් පමණකි.

**බාල වයස් කරුවන්ගේ මුදල්.**

38. බාල වයස් කාරයන්ට සංගමයේ රීති මාලාව යටතේ ගෙවිය යුතුවන සියලුම මුදල් ඔවුන්ගේ නමින් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ තැන්පත් කරනු ලැබිය යුතු ය. පාස්පොත් ලේකම් හා ගණකාධිකාරිවරයා භාරයේ තබා ගත යුතු ය.

## III වන පරිච්ඡේදය—දීමනා සහ දයක මුදල් ණය

**දීමනා සහ දයක මුදල් ණය.**

39. (1) 40 සහ 41 වැනි රීතිවල දක්වෙන උපරිමයන් දක්වා ණය දීම පාලක කාරක සභාව විසින් ස්වකීය අභිමතය පරිදි කළ හැකි ය. එසේ වුවද කිසියම් සාමාජිකයකු සිය වැටුප ප්‍රකාර එකී රීතිවල දක්වෙන මුදල් ප්‍රමාණයන්ට වැඩි ණය මුදලක් ලැබීමේ අයිතිය ලබා සිටියේ නම් ඒ ණය මුදල් ප්‍රමාණය ම ලබා ගැනීමේ අයිතිය අලුතින් ඔහුට හිමි විය යුතු ප්‍රමාණය යටතේ වෙනස්වීමක් සිදුවින තුරු සිහුට තිබේ.

(2) අවුරුදු පහකට නොඅඩු සාමාජිකත්වයක් ඇති සෑම සාමාජිකයකුටම, (ඔහු/ඇය හෝ ඔහුගේ/ඇයගේ ස්වාමියාගේ භාර්යාව හෝ ඔහුගේ/ඇගේ දරුවන් හෝ ඔහුගේ/ඇගේ පියා සහ මව සම්බන්ධව) පහත සඳහන් සිද්ධියකදී එම සිද්ධියෙන් සතිමසක් ඇතුළත නියමිත ලියකියවිලි සහිතව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් මත, පහත සඳහන් ප්‍රමාණය දක්වා වූ මුදලක්, පාලක කාරක සභාව විසින්, 40, 41 හා 59 වැනි රීති යටතේ ඒ සාමාජිකයාට ලැබී ඇති හිමිකමට අතිරේකව, එම කාරක සභාවේ අභිමතය පරිදි දීම නිත්‍යානුකූල වේ:—

| | | |
|---|---|---|
| | රු. | |
| (අ) සාමාජිකයාගේ විවාහය සඳහා ... ... ... ... | 500 | 0 |
| (ආ) ඔහුගේ හෝ ඇගේ දරුවෙකුගේ විවාහය සඳහා ... ... ... | 400 | 0 |
| (ඇ) භාර්යාවගේ හෝ පුරුෂයාගේ මරණය සඳහා ... ... ... ... | 500 | 0 |
| (ඈ) දරුවෙකුගේ, පියාගේ හෝ මවගේ මරණය සඳහා ... ... ... | 300 | 0 |

මෙම ණය මුදල රු. 20 බැගින් වූ වාරික වලින් මාස්පතා අය කර ගත යුතු ය.

ඉහතින් දැක්වෙන පරිදි මරණයක් සඳහා ණය මුදල් ප්‍රාදේශීය ආදායම් නිලධාරී විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මත හෝ, ප්‍රාදේශීය ආදායම් නිලධාරී විසින් පිටසන් කරන ලද ග්‍රාම සේවක සහතික මත හෝ පලාත් පාලන අයතනයේ සභාපති විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මත ගෙවිය හැකි ය.

40. දීමනා ණය මුදල පහත දක්වෙන පදනම මත දෙනු ලැබිය යුතු ය:—

(1) සාමාජිකත්වයේ පළමු අවුරුද්ද සඳහා රු. 100 ක මුදලක් ;

(2) සාමාජිකත්වයේ දෙවැනි අවුරුද්දේ සිට එක් අවුරුද්දකට රු. 50 බැගින් රු. 800 ක උපරිමය දක්වා අතිරේක මුදලක් ;

(3) සාමාජිකත්වයේ දහසය වැනි අවුරුද්දේ සිට එක් අවුරුද්දකට රු. 30 බැගින් රු. 1,220 ක උපරිමය දක්වා අතිරේක මුදලක්.

**දායක මුදල් ණය.**

41. තමන්ගේ දායක මුදල් අනුව ලබා ගත හැකි උපරිම ණය මුදල එක් එක් අවුරුද්දක ජනවාරි පළමුවැනිදා ට සාමාජිකයෙකුගේ බැර පක්ෂයේ ඇති දායක මුදල්වලින් සියයට 90 කි.

එක් එක් මාසයේ 10 වැනි දින හෝ ඊට පසු දිනක දිය හැකි ණය ප්‍රමාණය කොපමණද යනු ගණන් බැලීමේදී එම මාසය සඳහා අය කර ගැනීමට දන්වා ඇති ණය වාර කොටස අයකළාක් මෙන් ගණන් ගත යුතු ය.

42. 39 වැනි රීතිය යටතේ දිය හැකි අලුත් කිරීම් ද ඇතුලුව කවර හෝ මුදල් වර්ෂයක් ඇතුළත කරනු ලබන ණය දීම් සංඛ්‍යාව 8 කට සීමාවේ.

43. ණය සීමා කිරීමේ බලය කාරක සභාවට ඇත.

**ණය ආපසු ගෙවීම.**

44. (අ) 39 (2) වැනි රීතිය යටතේ ලබාගත් ණය මුදල්, ණය මුදල නිකුත් කළ මසට පසුව එළඹෙන මාසයෙන් පටන් ගෙන මාසික කොටස් සියයකට නො වැඩි ගණනකින් ආපසු ගෙවිය යුතු ය: එසේ වුවද ඒ මාසික කොටස රුපියල් පහකට අඩු නො විය යුතු ය.

(ආ) මෙම ණය මුදල් වෙනුවෙන් වූ අඩු කර ගැනීම් මාර්තු සහ දෙසැම්බර් යන මාසවල දී කිසිදු සාමාජිකයකුගෙන් අඩු කර ගනු නොලැබිය යුතු ය. එසේ වුවද ණය මුදල සඳහා වූ පොළිය මේ මාස දෙකේදී ද අය කර ගනු ලැබිය යුතු ය.

**ණය ඉල්ලුම් පත්‍රය.**

45. පාලක කාරක සභාවෙන් අනුමත වූ ඉල්ලුම් පත්‍ර ආකෘතිය, ප්‍රකාශ පත්‍ර ආකෘතිය හා අනිකුත් ලියවිලි සම්පූර්ණ කිරීම ණය ඉල්ලුම්කරු විසින් කළ යුතු ය.

**ගෙවිය යුතු පොලිය.**

46. සංගමයෙන් ණයට ගත් මුදල් සඳහා සෑම මාසයකම අවසානයේදී ගෙවිය යුතු පොලිය එක් එක් මාසයේ අවසානයේදී ණයට තිබූ මුදල වෙනුවෙන් 1962.6.1 වැනි දින සිට වර්ෂයකට සියයට හත බැගින් වූ මුදලකි. පොළිය ගණන් බැලීමේදී මාසයක දින පහළොවකට වැඩි කොටස පූර්ණ මාසයක් හැටියටත් දින පහළොවක් හෝ ඊට අඩු කොටස අර්ධ මාසයක් හැටියටත් සැලකිය යුතුය. පොලී ගෙවීමට නියමිත දිනය එක් එක් ලිත් මාසය අවසන් දිනයයි. ණය මුදල ලබා ගත් මසට පසුව එළඹෙන ලිත් මාසයේ අවසන් දිනයේදී ප්‍රථම පොලී ගෙවීම කරනු ලැබිය යුතු ය.

ප්‍රතික්ෂේප කිරීමේ හේතු.

47. හේතු නො දක්වා ඕනෑම ඉල්ලුම් පත්‍රයක් ප්‍රතික්ෂේප කිරීමේ බලය පාලක කාරක සභාවට ඇත. ණය මුදලක් දීමට පෙර ස්වකීය අභිමතය පරිදි, කිසියම් තොරතුරක් ඉල්ලා සිටීම හෝ කිසියම් කරුණක් ඔප්පු කරන ලෙස නියම කිරීම කාරක සභාව විසින් කළ හැකිය.

හිඟ මුදල්.

48. දායක මුදල්, ණය වාර මුදල් සහ වෙනත් අයවීම්වල හිඟ සිටි සියලුම මුදල් ණය ඉල්ලුම් කරන අවස්ථාවේ සාමාජිකයා විසින් ලැබිය හැකි ණය මුදලින් හෝ ආපසු ගන්නා ඉතිරි කිරීමේ දායක මුදල් වලින් අය කර ගෙන මිස, කිසිදු ණයක් දෙනු නො ලැබිය යුතු ය.

වාරික ගණන අඩු කිරීම.

49. ස්වකීය අභිමතය පරිදි, කවර අවස්ථාවකදී වුවද ණය මුදල ආපසු ගෙවීමේ වාරික ගණන අඩු කිරීමේ හෝ ණය මුදල එකවර පියවන ලෙස බල කර සිටීමේ අයිතිය පාලක කාරක සභාවට ඇත.

ගෙවීමට නියමිත මුදල් යැවීම.

**50. පඩි පතින් වාරික අඩු කර ගැනීම සහ එම මුදල් ලේකම් හා ගණකාධිකාරී වෙත යැවීමත් සිදුවන බවට සාමාජිකයන් වග බලා ගත යුතුය.**

ගෙවීම පැහැර හැරීම.

51. (1) අනුගාමී මාස හයක් සඳහා ණයක් වෙනුවෙන් සහ/හෝ පොලී වෙනුවෙන් ගෙවිය යුතු වාරික ගෙවීම පැහැර හරින සාමාජිකයකුගේ සාමාජිකත්වය අහිමි වන අතර ඔහු සංගමයෙන් අස් වූවකු ලෙසින් සලකනු ලැබිය යුතුය. අය විය යුතු මුදලක් තව දුරටත් ඉතිරි වී තිබේ නම්, ඔහු විසින් අත්සන් තබා ඇති බලය පැවරීමේ ලිපිය ප්‍රකාර එය අය කර ගත යුතුය. වාරික ගෙවීම හිඟ හිටවා ඇති සාමාජිකයකු විසින් කරනු ලබන යම් ගෙවීමක් වේ නම් ඒය පළමුවෙන්ම පොලිය සහ ණය මුදලලේ ඉතිරි හිඟය පියවීම සඳහා යොදා ගත යුතුය.

(2) ගෙවීම පැහැර හැරීම පටන් ගන්නා දිනය වශයෙන් සැලකිය යුත්තේ වාරික ගෙවීමට නියමිත මාසයේ පළමුවැනි දිනයය.

52. සාමාජිකයන්ගෙන් හෝ හිටපු සාමාජිකයන්ගෙන් හෝ නො එසේ ව වෙනත් අයවලුන්ගෙන් හෝ සංගමයට අය විය යුතු මුදල් අය කර ගැනීම සඳහා නීති මාර්ගයෙන් ගන්නා පියවර ඇතුළුව සියලුම පියවර ගැනීමේ සම්පූර්ණ බලය කාරක සභාව සතු ය.

53. සාමාජිකත්වය අහිමිවීමෙන් හය මසක් ඇතුළත ලිඛිත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබූ විට හා සාමාජිකත්වය නැවත දෙනු ලබන දිනය තෙක් සංගමයේ සාමාජිකයකු වශයෙන් සිටියේ නම් සංගමයට ගෙවිය යුතුවන සියලුම මුදල් ගෙවනු ලැබීමෙන් පසුවද යම් තැනැත්තකුගේ සාමාජිකත්වය නැවත ලබා දීමේ බලයද කාරක සභාවට ඇත.

ණය කලින් පියවාලීම.

54. තමන් කැමති නම්, පියැවීමට ඉඩ දී ඇති කාලයට පෙර ස්වකීය ණය මුදල පියවාලීම සාමාජිකයකු විසින් කළ හැකිය.

අය විය යුතු මුදල් අය කර ගැනීම.

55. විශ්‍රාම යාමේදී, ඉල්ලා අස්වීමේදී, සේවයෙන් පහ කිරීමේදී හෝ සංගමයෙන් අස්වීමේදී නැත්නම් මරණය හේතු කොට ගෙන සාමාජිකයකුගෙන් අය විමට ණය මුදලක් හෝ පොලී මුදලක් ඉතිරිව තිබේ නම් එය, ඔහුට හෝ ඔහුගේ යෝජිතයන්ට හෝ යෝජිතයන් නොමැතිනම් නීත්‍යානුකූල උරුමක්කාරයන්ට සංගමයේ රීති ප්‍රකාර ගෙවීමට නියමිත මුදලෙන්, අඩු කර ගත යුතුය. සංගමයෙන් ඉල්ලා අස්වන සාමාජිකයන්ගෙන් සංගමය වෙත තවදුරටත් අයවීමට ඉතිරිව, එහෙත් අය කර ගෙන නොමැති කිසියම් මුදලක් හා අයවීමට තිබෙන ණය මුදලක් හෝ පොලිවල හෝ ඉතිරි හිඟයක් ද සාමාජිකයා විසින් අත්සන් තබා ඇති බලය පැවරීමේ ලිපිය ප්‍රකාර හෝ සංගමය මඟින් නිගමනය කරන වෙනත් පිළිවෙලකින් හෝ අයකර ගනු ලැබිය යුතු ය.

## IV වන පරිච්ඡේදය—ඉතිරි කිරීමේ යෝජනා ක්‍රමය

56. ඉතිරි කිරීමේ යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය—

1957.10.1 දිනට පෙර එම යෝජනා ක්‍රමයට බැඳුනු අය සම්බන්ධයෙන් නම් 1956.1.1 දින සිට හෝ ඉන් පසුව ද

1957.10.1 දිනට පෙර සංගමයට බැඳුනු අය සම්බන්ධයෙන් නම් 1957.10.1 දින සිට ද

1957.9.30 දිනට පසු සංගමයට බැඳුණු අය සම්බන්ධයෙන් නම්, ඒ අය සංගමයට බැඳුනු දින සිටත් ආරම්භ වේ.

57. (1) සෑම සාමාජිකයකුට ම තමන්ට රිසි පරිදි රුපියල් තුනක මුදලක් හෝ (රුපියලේ ගුණිත වලින්) ඊට වැඩි මුදලක් මාස් පතා ගෙවිය හැකිය. මෙම මුදල එක් එක් මාසය අවසානයේ පඩි පතින් අඩු කර ගත යුතු ය. මේ මුදල මාස් පතා ලේකම් හා ගණකාධිකාරී වෙත යැවෙන බවට එක් එක් සාමාජිකයා වග බලා ගත යුතු ය. පාලක කාරක සභාව විසින් විශේෂ කාරණයක් නිමිති කොට මේ දිනයන් වෙනස් කිරීමට ඉඩ දෙන අවස්ථාවකදී හැර, මෙකී දායක මුදලේ අඩු කිරීමක් හෝ වැඩි කිරීමක් සිදු කර ගත හැක්කේ යම් අවුරුද්දක ජනවාරි 1 ද හෝ ජූලි 1 වැනි ද සිට පමණය.

(2) ඉතිරි කිරීමේ දායක මුදල රුපියලේ සිට රුපියල් දෙක දක්වා වැඩිවීම 1968. 6. 1 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතුය. ඉතිරි කිරීමේ දායක මුදල රුපියල් දෙකේ සිට රුපියල් තුන දක්වා වැඩිවීම 1973. 01. 01 දින සිට ක්‍රියාත්මක විය යුතුය.

58. (1) මේ ආකාරයෙන් අය කර ගන්නා දායක මුදල් එක් එක් සාමාජිකයාගේ ගිණුම වෙත වෙන වෙනම බැර කර ඔහුගේ පාස් පොතේ සටහන් කරනු ලැබිය යුතුය. එක් එක් වර්ෂය අවසානයේ දී, එම වර්ෂය තුළ ඉවත් කර ගත් මුදල් ප්‍රමාණය අත්හැර, ඒ වර්ෂය ආරම්භයේ දි එකතු වී තිබෙන පොලියටත් ඉතිරි කිරීමේ යෝජනා ක්‍රමයේ සාමාජිකයාගේ බැරට තිබෙන මුදලටත් පොලී එකතු කරනු ලැබේ. පොලී ප්‍රමාණය සියයට $4\frac{1}{2}$ ක් වන අතර එය සංගමයේ ලාභවල වැය බරක් විය යුතු ය.

(2) සාමාජිකත්වය අවසන් වීමක දී, සාමාජිකත්වයේ අන්තිම මාසය දක්වා එක් එක් ලින් මාසය වෙනුවෙන් පොලී ගෙවනු ලැබිය යුතු ය.

(3) සියයට $4\frac{1}{2}$ පොලී ප්‍රමාණය 1972. 01. 01 දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

59. (1) සාමාජිකත්වය නිම වූ විට හෝ සංගමයේ රීති අනුව යෝජනා ක්‍රමය ඉවත් කැරුණු විට, සංගමයට අය විය යුතු මුදලක් වේ නම් අය කර ගෙන, පොලියත් සමග දායක මුදල් ආපසු දෙනු ලැබේ.

(2) එක් ලින් වර්ෂයක් ඇයතුලත තමන්ගේ බැර පක්ෂය වෙත ඇති දායක මුදල් වලින් සියයට 25 ක ප්‍රමාණයක් සහ වැඩිපුර දායක මුදල් වේ නම් එයින් සියයට 25 ක මුදලක් ද සාමාජිකයකු විසින් පාලක කාරක සභාවේ අභිමතය පරිදි ආපසු ගත හැකිය. මේ අනුව ඉවත් කර ගැනීමට ලැබෙන අඩුම ගණන රුපියල් විසිපහක් විය යුතු ය.

60. 40 සහ 41 රීති යටතේ ලබා ගැනීමට අයිතිවාසිකම් ඇති ණයට, ආපසු ගත් මුදල් හැර එක් එක් අවුරුද්ද ආරම්භයේ දි ඉතිරි කිරීමේ යෝජනා ක්‍රමයේ සාමාජිකයාගේ බැරට ඇති මුදලින් සියයට 50 ක් එකතු කිරීම පාලක කාරක සභාවේ අභිමතය පරිදි කළ හැකිය. මේ අනුව දෙනු ලබන අඩුම ණය ප්‍රමාණය රුපියල් විසිපහට නොඅඩු විය යුතු ය.

## V වැනි පරිච්ඡේදය—ආපදා ණය

61. සාමාජිකයාගේ හෝ සාමාජිකාවගේ රෝගී අවස්ථාවලදී හෝ සාමාජිකයාගේ හෝ සාමාජිකාවගේ පවුලේ අයකුගේ රෝගී අවස්ථාවලදී හෝ සතුටුදායක ලෙස පිළිගත හැකි වෙනත් කරුණු උදෙසා, පාලක කාරක සභාවේ අභිමතය පරිදි ආපදා ණයක් දෙනු ලැබිය හැකිය. මෙම පරිච්ඡේදය යටතේ දෙනු ලබන ණය, III වැනි පරිච්ඡේදය යටතේ දෙනු ලබන ණය වලට වඩා ප්‍රමුඛත්වයක් නොලබන අතර යම්කිසි අවස්ථාවකදී සාමාජිකයන්ගෙන් අයවීමට ඇති මුළු ණය ප්‍රමාණය රු. 25,00,000 නොඉක්මවිය යුතු ය.

62. (1) ස්වකීය පත්වීම ස්ථිර කර ඇත්තා වූද අවුරුදු තුනේ සිට පහක් දක්වා කාලයක සාමාජිකත්වයක් ඇත්තාවූද සාමාජිකයින් හට, එවැනිම සුදුසුකම් ඇති සාමාජිකයෙක් හෝ අවුරුදු පහකට වැඩි කාලයක සාමාජිකත්වයක් ඇති සාමාජිකයකුගේ ඇපවීම පිට රුපියල් පන්සියයක උපරිමය දක්වා වූ ආපදා ණය මුදලක් ගෙවනු ලැබිය හැකි ය.

(2) පස් අවුරුදු කාලයකට වැඩි සාමාජිකත්වයක් ඇති සාමාජිකයෙකු හට, පස් අවුරුදු කාලයකට වැඩි සාමාජිකත්වයක් ඇති සාමාජිකයෙකුගේ ඇපය පිට රුපියල් දාහක උපරිමය දක්වා වූ ආපදා ණය මුදලක් ගෙවනු ලැබිය හැකි ය.

63. පාලක කාරක සභාව විසින් අනුමත කරන ලද ඉල්ලුම් පත්‍ර ආකෘතියක් ආපද ණය ඉල්ලුම්කරු විසින් සම්පූර්ණ කල යුතු අතර ඉල්ලුම් පත්‍රයේ සඳහන් කරුණු, ඉල්ලුම්කරු විසින් සතුටුදායක පරිදි ඔප්පු කරනු ලැබිය යුතු ය.

64. පොලී ප්‍රමාණය වර්ෂයකට සියයට හතක් විය යුතු ය.

65. ණය මුදල ආපසු අයකර ගැනීම ණය මුදල අනුමත කරන ලද මාසයට පසුව එළඹෙන මාසයෙන් පටන් ගෙන හතලිහකට නොවැඩි මාසික කොටස් ගණනකින් සම්පූර්ණ කළ යුතු ය.

66. III පරිච්ඡේදය යටතේ වූ අංක 42, 47, 48, 49, 50, 51 සහ 52 දරන රීතීන් මෙම පරිච්ඡේදයට අදාළ විය යුතුය. විධිවිධාන සලස්වනු නොලැබූ වෙනත් කරුණකට 1 වැනි පරිච්ඡේදයේ 24 වැනි රීතිය අදාල විය යුතු ය.

67. නිවාස අළුත්වැඩියා කිරීමේ ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා ඇති සහ/හෝ එම ණය සඳහා ඇපකරුවන් වශයෙන් පෙනී සිටි සාමාජිකයින්ට මෙම පරිච්ඡේදය යටතේ ණයක් ලැබීමේ අයිතිය ලැබෙන්නේ නිවාස අළුත්වැඩියා කිරීමේ ණය යෝජනා ක්‍රමය යටතේ ලබාගෙන ඇති සහ/හෝ ඇපවී ඇති ණය මුදල සම්පූර්ණයෙන් ආපසු ගෙවා නිම වූවාට පසුව ය.

## VI වන පරිච්ඡේදය—නිවාස දේපළ ණය

*කමිටුව විසින් නිවාස දේපළ ණය දිය හැකි බව.*

68. සාමාජිකයාට හෝ ඔහුගේ භාර්යාවට අයිති නිවාස දේපළ හෝ ඉඩම ඇප වශයෙන් තබා ගෙන සාමාජිකයන්ට පහත සඳහන් කාරණයන් සඳහා පාලක කමිටුව විසින් ස්වකීය අභිමතය පරිදි ණය දිය හැකි ය :—

(i) නිවාසයක් තනා ගැනීමට.
(ii) පදිංචි නිවාසයට අමතර කොටස් එකතු කිරීමට, සහ/හෝ ඒ නිවාසය අළුත්වැඩියා කිරීමට.
(iii) පදිංචියට නිවාසයක් මිලට ගැනීමට.
(iv) තමාගේ පදිංචිය සඳහා නිවසක් තනා ගැනීමට ඉඩම් කැබැල්ලක් මිලට ගැනීමට.

කිසිම අවස්ථාවක සාමාජිකයන්ගෙන් අයවීමට ඇති මුළු ණය ප්‍රමාණය රු. 50,00,000 නො ඉක්මවිය යුතු ය.

*ණය ඉල්ලුම් පත, ඉදිරිපත් කළ යුතු කාලය හා පිළිවෙල.*

69. ණය ඉල්ලුම් පත්‍රය, ලේකම් හා ගණකාධිකාරීගෙන් ලබාගත් අනුමත කරන ලද ආකෘති පත්‍රයක ඉල්ලුම් පත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. නිවාස දේපොල ණය සඳහා ඉල්ලුම් පත් කැඳවීම පුවත් පත්වල භාෂා තුනෙන්ම පළ කරනු ලබන දැන්වීමක් මගින් කළ යුතුය.

*ණය මුදල් දීමට තීරණය කිරීම පාලක කමිටුව විසින් කළ යුතු බව.*

70. ඉල්ලුම් පත්, ඒවා ලැබුණ දිනයන් අනුව ලේඛන ගත කිරීමෙන් පසු ලේකම් සහ ගණකාධිකාරීවරයා විසින් එම ඉල්ලුම් පත් පාලක කමිටුවේ තීරණය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. ණය මුදල් දිය යුත්තේ, සංගමයේ නීතිඥයින් විසින් සපයනු ලබන ඉඩමේ භුක්තිය සම්බන්ධ සතුටුදායක වාර්තාවක් සහ පාලක කමිටුව විසින් පත් කරනු ලබන ඇගයුම් කරුවන් විසින් සපයනු ලබන ඇගයුම් වාර්තාවක් ලැබුණු පසු පමණය.

*ණය මුදල් ප්‍රතික්ෂෙප කිරීම පාලක කමිටුව විසින් කළ හැකිය.*

71. ණය මුදල අනුමත කිරීම හෝ ඉල්ලුම් කර ඇති මුළු මුදල හෝ ඉන් කොටසක් දීම ප්‍රතික්ෂේප කිරීම, ඊට හේතු දක්වමින් පාලක කමිටුව විසින් කළ හැකිය.

*උකස්කර සහ ඒ සඳහා වියදම්.*

72. (1) පාලක කමිටුව විසින් පත් කරනු ලබන නොතාරිස් කෙනෙකු විසින් අවශ්‍ය උකස්කරය පිළියෙල කර සහතික කළ යුතු අතර එම ණයට සම්බන්ධ නීතිමය කටයුතු සම්පූර්ණ කිරීම සඳහා වැය වෙන මුළු වියදම ණය ඉල්ලුම්කරු විසින් දැරිය යුතු ය.

(2) රුපියල් 5,000 හෝ ඊට වැඩි ණය මුදල් සඳහා සංගමය විසින් ගිනි ආරක්ෂණ ඔප්පු ලබාගත යුතු ය.

(3 ගිනි ආරක්ෂණ ඔප්පු සඳහා මුදල් සංගමය විසින් කලින් ගෙවා, එම ගෙවූ මුදල සහ 77 වැනි රීතියේ නිශ්චිතව සඳහන් පොලියද, ණය මුදල ගෙවීමෙන් පසු මැර්තු සහ දෙසැම්බර් මාසයන්ද අතුලත්ව, මාස් පතා වාරික දොළහකින් සාමාජිකයාගෙන් අයකර ගත යුතු ය.

*දිය හැකි උපරිම හා අවම ණය ප්‍රමාණ.*

73. (1) දිය හැකි උපරිම ණය ප්‍රමාණය රු. 20,000 ක් වන අතර ණය ප්‍රමාණය කුමන හේතුවක් නිසාවත් ඇප වශයෙන් තබන දේපලෙහි ඇගයූ වටිනාකමින් සියේට හැටකට වැඩි නොවිය යුතු ය. දිය හැකි අවම ණය මුදල රු. 2,000 ක් වේ. 68 වන රීතියේ ii ඡේදය යටතේ අලුත්වැඩියා සඳහා දෙනු ලබන වැඩිම ප්‍රමාණය රුපියල් 5,000 ට වැඩි නොවිය යුතු ය.

73. (2) නිවාසයක් තනා ගැනීම සඳහා ණය ඉල්ලුම් පතක් ඉදිරිපත් කරන සාමාජිකයෙකු විසින් ඉදිරිපත් කරනු ලබන ඇපය ප්‍රමාණවත් නොවන අවස්ථාවකදී, ඇපයට තබනු ලබන දේපොලෙහි වැඩිවන වටිනාකම මත පහත දැක්වෙන ක්‍රමය අනුව ණය මුදල වාරික වශයෙන් ගෙවිය හැකිය :—

1 වැනි වාරිකය : උකස්කරය ලියා අත්සන් කර ලියාපදිංචි කළ විට,
2 වැනි වාරිකය : ගොඩනැගිල්ලේ අත්තිවාරම දිය සීරාවරණ මට්ටමට නැගූ විට,
3 වැනි වාරිකය : උලුවහු සහ ජනේල උලුවහු සවිකර වහලේ මට්ටම තෙක් බිත්ති බැන්ද විට, බැඳීමෙන් පසු දෙර ජනේල සවි කිරීමට අදහස් කරන්නේ වහල ගැසීමෙන් පසුව නම් මෙම කරුණ සඳහා ගෙවන ණය මුදල ගෙවීම අත්හිටවිය හැකි ය.

4 වැනි වාරිකය : වහලේ වැඩ සම්පූර්ණ කළ විට,

5 වැනි වාරිකය : මුළු නිවාසයේ වැඩ සතුටුදායක ලෙස සම්පූර්ණ කළ විට හා අවශ්‍ය නම් ගිනි ආරක්ෂණ සහතිකයක් ඉදිරිපත් කළ විට සහ පළාත් පාලන ආයතනයේ රීති අනුව ගොඩනැගිල්ල තනා ඇති බවට සහතිකයක් ඉදිරිපත් කළ විට.

(3) පළමුවැනි වාරිකය ගෙවා වසරක් ඇතුළත ගොඩනැගිල්ලේ වැඩ සම්පූර්ණ කළ යුතු ය. ණය ලබන්නා විසින් ප්‍රමාණවත් ලෙස කරුණු ඉදිරිපත් කළහොත් ඊට අමතරව තවත් හය මසක් කල්දීම පාලක කාරක සභාව විසින් කළ හැකිය.

ඇපය සඳහා ඉදිරිපත් කරනු ලබන දේපල පිහිටා තිබිය යුත්තේ කවර සීමාවන් ඇතුළතද යන වග.

**74. ඇපය සඳහා ඉදිරිපත්** කරනු ලබන දේපොල කිසියම් හෝ පළාත් පාලන ආයතනයක පරිපාලන සීමාවන් තුළ පිහිටා තිබිය යුතු ය.

සාමාජිකයින්ගේ සුදුසුකම්.

75. ණය ඉල්ලුම් පත ඉදිරිපත් කරන අවස්ථාවේදී අඩු වශයෙන් සංගමයේ අවුරුදු පහක සාමාජිකත්වයක් ඇතිව සිටියේ නම් සහ තමාගේ වයස අවුරුදු පණහකට අඩු වී නම් මිස, කිසිම සාමාජිකයකු ණයක් ලැබීමට සුදුස්සෙක් නොවේ.

තමන්ගේ නමින් හෝ භාර්‍යාවගේ නමින් හෝ දෙදෙනාගේ නමින් රු. 20,000 කට වැඩි වටිනාකමක් ඇති නිවාසයක් අයිති සාමාජිකයෙකුට විනා එම නිවාසයට කොටස් එකතු කිරීම සහ/හෝ එම නිවාසය අලුත්වැඩියා කිරීම සඳහා වෙන කිසිම කරුණක් සඳහා ණය මුදලක් නොදිය යුතු ය.

ආපසු ගෙවීම.

76. (1) වයස අවුරුදු තිස්පහකට වැඩි සාමාජිකයින්ට ණය මුදල් ගෙවන අවස්ථාවලදී, විශ්‍රාම ගැනීමට නියම වයස සම්පූර්ණ වීමේදී ණය මුදල ආපසු ගෙවා නිම කිරීම සඳහා වග බලා ගැනීම් වස්, අවුරුදු පනස් පහ සම්පූර්ණ වීමට ඉදිරියට ඇති අවුරුදු ගණන අනුව ණය මුදල ආපසු ගෙවීම සඳහා අනුමත කරනු ලබන වාරික ප්‍රමාණය තීරණය කළ යුතු ය.

(i) වයස අවුරුදු තිස්පහක් වන හෝ ඊට අඩු සාමාජිකයකු අවුරුදු විස්සක් තුළ විසුරුණු වාරිකවලින් ගෙවීමට ඉඩ ලැබිය යුතු ය.

(ii) වයස අවුරුදු තිස්පහට වැඩි, හතළිහට අඩු, වයස් ඇති සාමාජිකයකු අවුරුදු පහළොවක කාලයක් තුළ විසුරුනු වාරිකවලින් ගෙවීමට ඉඩ ලැබිය යුතු ය.

(iii) වයස අවුරුදු හතළිහ සම්පූර්ණ, එහෙත් හතළිස් පහට නොවැඩි සාමාජිකයකුට අවුරුදු දහයක කාලයක් තුළ විසුරුනු වාරිකවලින් ගෙවීමට ඉඩ ලැබිය යුතු ය.

(iv) වයස අවුරුදු හතළිස් පහට වැඩි, අවුරුදු පනහට නොවැඩි සාමාජිකයකු අවුරුදු පහක කාලයක් තුළ විසුරුනු වාරිකවලින් ගෙවීමට ඉඩ ලැබිය යුතු ය.

(2) මාසික අඩු කිරීම්, සාමාජිකයාගේ වේතනයෙන් අඩු කළ යුතු අතර රජයේ නියමිත අඩු කිරීමේ සීමාවන් නොඉක්ම විය යුතුය. වෙනත් අඩු කිරීම් නිසා ඉහත දැක්වූ අඩු කිරීමේ සීමාව ඉක්මවීමේ හේතුවෙන් සාමාජිකයාගේ වාරික මුදල සහ පොළිය පඩි පතින් අඩු කළ නොහැකි නම් ණය මුදලේ නියමිත වාරිකය සහ පොළිය ද ගෙවීමට නියමිත දිනයට හෝ ඊට පෙර සාමාජිකයා විසින් කෙලින්ම සංගමයට ගෙවිය යුතු ය. ගෙවිය යුතු වාරික මුදල සහ පොළිය නියමිත දිනයට පෙර ගෙවන බවට වග බලා ගැනීමට අවශ්‍ය පියවර සාමාජිකයා විසින් ගත යුතු ය.

(3) නිවාසයක් තැනීම සඳහා, දුන් ණයකදී පළමු ණය වාරිකය ලැබී මාස දහ අටක් ගතවීමට පෙර ණය මුදල ආපසු ගෙවීම ආරම්භ විය යුතු ය.

(4) නිවාසයට අමතර කොටස් එකතු කිරීම සඳහා හෝ පදිංචියට නිවාසයක් ගැනීම සඳහා දුන් ණයකදී ණය මුදල් ගෙවා සය මසක් ඇවෑමෙන් ණය මුදල ආපසු ගෙවීම ආරම්භ විය යුතු ය.

පොලී ප්‍රමාණය හා ගෙවිය යුතු දිනය.

77. පොලී ප්‍රමාණය, සංගමයේ බැංකු කරුවන් විසින් දෙන අයිරා සඳහා එවකට අය කරනු ලබන පොලී ප්‍රමාණය, මුදලට වඩා සියයට් දෙකකින් වැඩි ප්‍රමාණයක් විය යුතුය. මුල් ණය මුදල නිකුත් කළ මසට පසුව එළඹෙන මාසයෙන් පටන් ගෙන මාස් පතා, මාසයේ පළමුවැනි දින අඩුවෙමින් ඉතිරිවන මුල් මුදල වෙනුවෙන් පොළිය ගෙවිය යුතු ය.

ගෙවීම් පැහැර හැරීම.

78. මෙම රීති යටතේ දෙනු ලැබූ ණයකට සම්බන්ධ අනුගාමී මාස තුනක වාරික හෝ ඊට අයවිය යුතු පොළිය ගෙවීම පැහැර හැරිය හොත් අයවිය යුතු මුළු මුදල සහ නඩු ගාස්තුව අයකර ගැනීම සඳහා උකස්කරය සම්බන්ධයෙන් නඩු පැවරීමට පාලක කමිටුවට බලය ඇත්තේ ය.

සාමාජිකත්වය අවසන් වූ විට ණය මුදල ආපසු ගෙවිය යුතු බව.

79. (1) මෙම රීති යටතේ ණයක් දෙනු ලැබූ සංගමයේ සාමාජිකයකුගේ සාමාජිකත්වය අවශ්‍ය වූ විට ඒ මුළු ණය සම්පූර්ණයෙන් ආපසු ගෙවිය යුතුය. එසේවුවද වුවද සාමාජිකත්වය අවසානවීමට හේතුව නියමිත කාලයට පෙර විශ්‍රාම ලැබීම නම් ගෙවිය යුතු ඉතිරි මුදල පාලක කමිටුව විසින් නියම කරනු ලබන වැඩි මනත් සහ වෙනත් කොන්දේසිවලට යටත්ව වාරික වලින් ආපසු ගෙවීමට ඉඩදීම පාලක කමිටුවේ පරම අභිමතය පරිදි කළ හැකිය.

(2) මෙම රීතියේ (1) ඡේදයේ කුමක් සඳහන් වුවද, සාමාජිකයකුට වාරික වලින් ආපසු ගෙවීමට ඉඩදී ඇති යම් ණය මුදලකින් නොගෙවා ඉතිරිව ඇති සම්පූර්ණ මුදල වහාම ගෙවන ලෙස නියම කිරීම පාලක කමිටුව විසින් කවර අවස්ථාවකදී වුවද කළ හැකිය.

සාමාජිකයකුගේ මරණය සිදුවූ අවස්ථාවක දී යෝජිතයන්, බූදල් බලකරුවන් සහ බූදල් පාලකයින් යනාදීන්ගේ බැඳීම.

80. (1) සාමාජිකයෙකුගේ මරණය සිදුවූ අවස්ථාවකදී, ඔහු විසින් ගෙවීමට ඉතිරිව ඇති ණය මුදල සහ ඊට අදාළ මුළු පොළියත් සම්පූර්ණයෙන් ගෙවීමට ඔහුගේ යෝජිතයන්, බූදල් බලකරුවන්, බූදල් පාලකයින් හෝ නීත්‍යානුකූල උරුමක්කාරයින් බැඳී සිටිය යුතු ය.

(2) ගෙවීමට ඉතිරිව ඇති මුදල පාලක කමිටුව විසින් නියම කරනු ලබන වැඩිමනතක් හෝ වෙනත් කොන්දේසි මත ආපසු ගෙවීමට මියගිය සාමාජිකයාගේ බුදල්කරුවන්ට හෝ බුදල් පාලකයන්ට හෝ නීත්‍යානුකූල උරුමක්කාරයින්ට ඉඩදීම, පාලක කමිටුව විසින් ස්වකීය අභිමතය පරිදි කළ හැකිය.

එසේ වුවද වාරික වලින් ආපසු ගෙවීමට ඉඩ දීමේ තීරණය ඒ බුදල් බලකරුවන්, බුදල් පාලකයින් හෝ නීත්‍යානුකූල උරුමක්කාරයින්ට දන්වන විට, ඒ තීරණය නොසලකා තුන්මස් කාලයක දැන්වීමකින් පසු ඉතිරිව ඇති සම්පූර්ණ ණය මුදල ආපසු ගෙවන ලෙස නියම කිරීමට පාලක කමිටුවට බලය ඇති බව ද දැන්විය යුතු ය.

81. පාලක කමිටුව විසින් මෙම පරිච්ඡේදය යටතේ ආයෝජනය කළ හැකි මුදල් ප්‍රමාණය පාලක කමිටුවේ අභිමතය පරිදි, සීමා කරනු ලැබිය හැකි ය. — ණය දීමේ සීමා.

82. ඇප වශයෙන් ඉදිරිපත් කරනු ලබන දේපොලවල ඇගයුමක් කිරීම සඳහා පාලක කමිටුව විසින් ඇගයුම් කරුවන් දෙදෙනෙකු පත් කළ යුතු ය. ඉන් එක් අයෙක් වෘත්තියෙන් ඇගයුම්කරුවකු විය යුතු අතර අනෙක් තැනැත්තා පාලක කමිටුවේ සාමාජිකයෙකු විය යුතු ය. ඔවුන් විසින් කරනු ලබන තක්සේරුව දිවුරුම් පිට හෝ සහතික ප්‍රකාශයක් වශයෙන් කළ යුතු ය. — ඇගයුම්කරුවන් පත් කිරීම.

83. (අ) වෘත්තියෙන් ඇගයුම් කරුවන තැනැත්තාට, ඉල්ලා ඇති ණය මුදලේ පළමුවැනි රුපියල් 2,000 සඳහා සියයට 1/2 බැගින් ද ඉතිරි මුදල් ප්‍රමාණය සඳහා සියයට 1/4 බැගින් ද ගෙවිය යුතු ය. එයට අමතරව ඔහු විසින් දැරීමට සිදුවන ගමන් ගාස්තු ද ගෙවිය යුතු ය. — ඇගයුම් කරුවන්ට ගෙවිය යුතු ගාස්තු.

(ආ) අනෙක් ඇගයුම්කරු වශයෙන් පත් කරනු ලබන පාලක කාරක සභාවේ සාමාජිකයා හට දැරීමට සිදුවන ගමන් ගාස්තු ගෙවිය යුතු අතර යැපීම් දීමනාවක් ද ගෙවිය යුතු ය.

84. උකස්කර ඇති දේපලවල වර්තමාන තත්ත්වය සහ වටිනාකම් සම්බන්ධව සැලකිලිමත්ව සෑම උකස්කරයක්ම කමිටුව විසින් සෑම දැවුරුද්දකට වරක්, නැවත සලකා බැලිය යුතු අතර අවශ්‍ය යයි කමිටුවට හැඟෙන්නේ නම් උකස්කර ඇති දේපොලවල තත්ත්වය සහ වටිනාකම පරීක්ෂාකර රපෝර්තු කිරීම සඳහා පාලක කමිටුවේ එක් සාමාජිකයෙකු හෝ ඊට වැඩි දෙනෙකු යෙදවිය යුතු ය. එවැනි පරීක්ෂා කිරීම් සඳහා යම් වියදමක් දැරීමට වේ නම් එය පාලන වියදමේ කොටසක් විය යුතු අතර එම වියදම සංගමයේ අරමුදලින් දැරිය යුතු ය. — දැවුරුද්දකට වරක් උකස්කර සමාලෝචනය කිරීම සහ උකස් කළ දේපොළ පරීක්ෂා කර බැලීම.

85. මේ පරිච්ඡේදයේ රීති යටතේ පාලක කමිටුව විසින් ණය මුදල දීම අනුමත කළ විගස සාමාජිකයා විසින් ඔහුගේ වියදමින් ඒ දේපල සංගමය වෙත උගසට තබා අවශ්‍ය උකස්කර සංගමයේ නමට ලියා අත්සන් කළ යුතු ය. ඒ උගස මුල් උගසක් විය යුතු ය. උකස්කරය හා සින්නක්කර ඔප්පුව ලියා අත්සන් කර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කරන තුරු අනුමත කළ ණය මුදල ඉල්ලුම්කරුට නොගෙවිය යුතු ය. — උකස්කරය ලියා අත්සන් කර ලියා පදිංචි කළ පසු ණය මුදල මුදලීම.

86. ඉහත දැක්වෙන රීතිය යටතේ සංගමයට උගස් කළ දේපළ, එම ණය මුදල සහ ඊට අදාළ පොළියත් හා ඒ සඳහා අය විය යුතු වෙනත් මුදලුත් සාමාජිකයා විසින් සංගමයට සම්පූර්ණයෙන් ගෙවා නිම කරන තෙක් වෙනත් කෙනෙකු වෙත පවරනු, වෙන් කර දෙනු හෝ විකුණනු නොලැබිය යුතුය. — ණයගැත්තා විසින් දේපොල විකිණීමට පෙර හෝ එය අන් අයෙකුට පැවරීමට පෙර ණය මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කිරීම.

87. පොලී වශයෙන් අය කර ගන්නා මුදලින් සියයට (භාගයකට) නොඅඩු ප්‍රමාණයක්, අලාභ පියවීම සඳහා සංචිත අරමුදලට බැර කළ යුතු ය. එහෙත් සංචිත අරමුදලේ බැරය එවකට හිඟ ණය මුදලින් දහයෙන් පංගුවක් ඉක්මවන කල්හි එම වැඩිවෙන ප්‍රමාණයෙන් අවශ්‍ය කොටසක් මහා සභා රැස්වීමේ අනුමැතිය ඇතිව පාලක කමිටුව විසින් ලාභ පාඩු ගිණුමට මාරු කළ යුතු ය. — සංචිත අරමුදල.

6-18—73.06.01 දින අංක 62 දරණ ගැසට් පත්‍රය

---

අංක : ඊ. 23/කො. 103/73.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගයයි.**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව එස්. සී. පෙරේරා මහතා, 108, 2 වන පටු මග, රත්මලාන සහ සිලෝන් ඔක්සිජන් ලිමිටඩ්, 50, ශ්‍රී සඳ්ධානන්ද මාවත, කොළඹ 15, අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කොළඹ 5, ගවර් වීදියේ අංක 26 හි නිව්ටන් එදිරිසිංහ මහතා වෙත මෙයින් යොමු කරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 මැයි මස 18 දින,
කොළඹ දී ය.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත**

එස්. සී. පෙරේරා මහතා,
108, 2 වන පටුමග,
රත්මලාන,
සහ
සිලෝන් ඔක්සිජන් ලිමිටඩ්,
50, ශ්‍රී සඳ්ධානන්ද මාවත,
කොළඹ 15,

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ඉහත සඳහන් පාර්ශවයන් අතර ආරවුලට හේතුවී ඇති කාරණා නම්, සිලෝන් ඔක්සිජන් ලිමිටඩ් හි පාලක පක්ෂය විසින් එස්. සී. පෙරේරා මහතා සේවයේ නොයෙදවීම යුක්ති සහගත ද යන්නත්, ඔහුට කුමන සහනයක් හිමිද යන්නත් පිළිබඳව වේ.

1973 මැයි මස 10 වැනිදා වූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

6-149—73.06.01 දින අංක 62 දරණ ගැසට් පත්‍රය

**බන්ධනාගාර ආඥා පනත**

35 (1) වැනි වගන්තිය යටතේ නිවේදනය

(54 වැනි අධිකාරය වන) බන්ධනාගාර ආඥා පනතෙහි 35 (1) වැනි වගන්තියෙන්, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමති, ෆීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, වතුපිටිවල තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලය සඳහා ප්‍රාදේශීය පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් 1973 මැයි මස 01 වැනි දින ඇරඹින වන එක් වර්ෂයක කාලයක් සඳහා, පූජ්‍ය පණ්ඩිත හේන්පිටගෙදර පියනන්ද ස්වාමීන් වහන්සේ, ඩී. එෆ්. අතුකෝරල මහතා, ඩී. ඩී. වීරවර්ධන මහතා සහ ආර්. ඇම්. සිරිවර්ධන මහතා මෙයින් පත් කරමි.

ෆීf. ආර්. ඩී. බණ්ඩාරනායක,
අධිකරණ ඇමති.

1973 මැයි මස 18 වෙනි දින,
කොළඹ දීය.

6–39/1—73.06.01 දින අංක 62 දරණ ගැසට් පත්‍රය

---

**බන්ධනාගාර ආඥා පනත**

35 (1) වැනි වගන්තිය යටතේ නිවේදනය

(54 වැනි අධිකාරය වන) බන්ධනාගාර ආඥා පනතෙහි 35 (1) වැනි වගන්තියෙන්, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමති, ෆීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, බෝගම්බර බන්ධනාගාරය සහ මහනුවර රිමාන්ඩ් බන්ධනාගාරය සඳහා ප්‍රාදේශීය පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන්, 1973 මැයි 01 වැනි දින ආරම්භ වන එක් වර්ෂයක කාලයක් සඳහා ඒ. එස්. ගුණතිලක මහතා, ඩී. පී. ජේ. කෝදාගොඩ මහතා, අශෝක යටවර මහතා සහ එච්. ඩී. පී. ප්‍රනාන්දු මහතා මෙයින් පත් කරමි.

ෆීf. ආර්. ඩී. බණ්ඩාරනායක,
අධිකරණ ඇමති.

1973 මැයි මස 18 වෙනි දින,
කොළඹ දී ය.

6–39/2—73.06.01 දින අංක 62 දරණ ගැසට් පත්‍රය

---

**බන්ධනාගාර ආඥා පනත**

35 (1) වැනි වගන්තිය යටතේ නිවේදනය

(54 වැනි අධිකාරය වන) බන්ධනාගාර ආඥා පනතෙහි 35 (1) වැනි වගන්තියෙන්, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමති, ෆීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, අනුරාධපුර බන්ධනාගාරය සහ එළිමහන් සිර කඳවුර සඳහා ප්‍රාදේශීය පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන්, 1973 මැයි 01 වැනි දින ආරම්භ වන එක් වර්ෂයක කාලයක් සඳහා ඇම්. ඒ. සිරිසේන මහතා, පී. බී. දිසානායක මහතා, එච්. බී. තෙන්නකෝන් මහතා සහ ඇස්. කේ. අර්නෝලිස් මහතා මෙයින් පත් කරමි.

ෆීf. ආර්. ඩී. බණ්ඩාරනායක,
අධිකරණ ඇමති.

1973 මැයි මස 18 වෙනි දින,
කොළඹ දීය.

6–39/3—73.06.01 දින අංක 62 දරණ ගැසට් පත්‍රය

---

**බන්ධනාගාර ආඥා පනත**

35 (1) වැනි වගන්තිය යටතේ නිවේදනය

(54 වැනි අධිකාරය වන) බන්ධනාගාර ආඥා පනතෙහි 35 (1) වැනි වගන්තියෙන්, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමති, ෆීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, කුණ්ඩසාලේ එළිමහන් සිර කඳවුර සඳහා, ප්‍රාදේශීය පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන්, 1973 මැයි 01 වැනි දින ආරම්භ වන එක් වර්ෂයක කාලයක් සඳහා, මොහොමඩ් අසරප් කාදර් මහතා, මුරපොලවත්තෙ ගුණදාස මහතා, උඩුවරගේ තෝමස් ගුණවර්ධන මහතා සහ කේ. බී. ජයසේකර මහතා මෙයින් පත් කරමි.

ෆීf. ආර්. ඩී. බණ්ඩාරනායක,
අධිකරණ ඇමති.

1973 මැයි මස 18 වෙනි දින,
කොළඹ දීය.

6–39/4—73.06.01 දින අංක 62 දරණ ගැසට් පත්‍රය

---

**1957 අංක 48 දරණ මෝටර් ප්‍රවාහණ ආඥා පනත**

1970 ජූලි මස 10 දින හා අංක 14,914 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීමට වැඩිමනත්ව, 1957 නේ අංක 48 දරණ මෝටර් ප්‍රවාහන ආඥා පණතෙහි 2 වෙනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතෙහි එක් එක් නාමය ඉදිරියෙන් සඳහන් කර ඇති දින සිට ඒ ඒ කාල පරිච්ඡේදයන් සඳහා පහත නම් සඳහන් මහත්වරුන් ලංකා ගමනාගමන මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් ප්‍රවාහන ඇමතිතුමා විසින් නැවත පත්කර ඇති බව මහජනයාගේ දැන ගැනීම පිණිස මෙයින් නිවේදනය කරනු ලැබේ.

1. අනිල් මූණසිංහ මහතා ... 1973 ජූනි මස 2 වැනි දින සිට 3 අවුරුදු කාල පරිච්ඡේදයකට.
2. පර්සි ඇහැලියගොඩ මහතා... 1973 ජූනි මස 16 වැනි දින සිට 3 අවුරුදු කාල පරිච්ඡේදයකට.
3. ජිතේන්ද්‍ර වීරමන් මහතා ... 1973 ජූනි මස 16 වැනි දින සිට 3 අවුරුදු කාල පරිච්ඡේදයකට.
4. ඞී. ජේ. ආර්. දිසානායක මහතා ... 1973 ජූනි මස 16 වැනි දින සිට 3 අවුරුදු කාල පරිච්ඡේදයකට.
5. කේ. ඩබ්ලිව්. සොයිසා මහතා 1973 ජූනි මස 16 වැනි දින සිට 3 අවුරුදු කාල පරිච්ඡේදයකට.
6. එම්. එල්. එම්. ජවුපර් මහතා 1973 ජූනි මස 16 වැනි දින සිට 3 අවුරුදු කාල පරිච්ඡේදයකට.

ඉහත සඳහන් පත්වීම්, 1957 අංක 48 දරණ මෝටර් ප්‍රවාහණ ආඥා පනතෙහි 2 වැනි වගන්තියෙහි (7) සහ (8) වැනි උප වගන්තිවල විධිවිධානවලට යටත් වේ.

පූර්වෝක්ත ආඥා පනතෙහි 2 වන වගන්තියෙහි (7) හා (8) වැනි උප වගන්තිවලට යටත්ව, 2 වගන්තියෙහි (1) වැනි උප වගන්තිය යටතෙහි, 1973 ජූනි මස 2 වැනි දින සිට තුන් අවුරුදු කාල පරිච්ඡේදයක් සඳහා ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපති ධුරයට ප්‍රවාහණ ඇමතිතුමා විසින් අනිල් මූණසිංහ මහතා නැවත පත්කර ඇති බවද, වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

කේ. සී. එෆ්. විජයවික්‍රම,
ලේකම්,
ප්‍රවාහණ අමාත්‍යාංශය.

කොළඹ,
1973 මැයි 15.

6–34—73.06.01 දින අංක 62 දරණ ගැසට් පත්‍රය

ආඥා අංක : 15

**1970 අංක 14 දරණ මහවැලි සංවර්ධන මණ්ඩල පනතේ 27 වැනි වගන්තිය යටතේ ආඥාව**

1970 අංක 14 දරණ මහවැලි සංවර්ධන මණ්ඩල පනතේ 27 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, වාරිමාර්ග, විදුලි බලය හා මහාමාර්ග ඇමති, මෛත්‍රීපාල සේනානායක වන මම මහවැලි සංවර්ධන මණ්ඩලයට අවශ්‍යවී ඇත්තාවූද පහත සදහන් උප ලේඛනයේ විස්තරකර ඇත්තාවූද ඉඩම් අත්කර ගැනීමේ යෝජනාව මෙම ආඥාව මගින් අනුමත කරමි.

මෛත්‍රීපාල සේනානායක,
වාරිමාර්ග, විදුලිබලය හා මහාමාර්ග ඇමති.

යොමු අංකය : වාරි.වි.ම./ලේ : ඩබ්/එම්ඩී/එල්ඒ/3/73.
යොමු අංකය : ම.ස.ම. ඊඑන්ජී/පීඹඑල්/9සී.

1973 මැයි මස 11 වෙනි දින, කොළඹදී ය.

උපලේඛනය

ශ්‍රී ලංකා ජනරජයේ මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ රත්තොට ආදායම් නිලධාරි කොට්ඨාශයේ මාරුකොණ අංක 360 ග්‍රාමසේවක වසමට අයිති මාරුකොන ගමේ පිහිටි ප්‍රමාණයෙන් අ. 0, රූ. 1, ප. 24 ක් පමණවූ ඉඩම් කැබලි හතරට මායිම් :—

**ලොට් අංක 1** : උල්පොත කුඹුර—ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 8.

උතුරට : දූන්ඔය ;
දකුණට : එම ඉඩමේ කොටසක් ;
නැගෙනහිරට : එම ඉඩමේ කොටසක් ;
බටහිරට : ඇල.

**ලොට් අංක 2** : වෙලේගෙදර කුඹුර—ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 38.

උතුරට : දූන්ඔය ;
නැගෙනහිරට : ඇල ;
දකුණට : එම ඉඩමේ කොටසක් ;
බස්නාහිරට : එම ඉඩමේ කොටසක්.

**ලොට් අංක 3** : වෙලේගෙදර කුඹුර—ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 13.

උතුරට : ඇල ;
නැගෙනහිරට : දූන්ඔය ;
දකුණට : ලොට් අංක 2 ;
බස්නාහිරට : එම ඉඩමේ කොටසක්.

**ලොට් අංක 4** : ඊරියගහකොටුව—ප්‍රමාණය : අ.0, රූ. 0. ප. 5.

උතුරට : එම ඉඩමේ කොටසක් ;
නැගෙනහිරට : එම ඉඩමේ කොටසක් ;
දකුණට : ඇල ;
බස්නාහිරට : එම ඉඩමේ කොටසක්.

හිමිකම් කියන අය : ලෙබ්බෙ තම්බි, එම්. එච්. මුහම්දිරම්, ඩබ්. වී. කරුණාතිලක, ඩබ්. වී. සද්දාතිස්ස, ඩබ්. වී. විමලතිස්ස, ඩබ්. වී. ප්‍රේමසීලි, ඩබ්. වී. දයාසීලි සහ එම්. බී. මුහම්දිරම්.

6-40—73.06.01 දින අංක 62 දරණ ගැසට් පත්‍රය

---

ඇල්.ඕ.—බී. 2/72
උවිප්‍ර/1/19/3

**1972 අංක 1 දරන ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය පනත 72 වන වගන්තිය යටතේ වූ නියමය**

1972 අංක 1 දරනා ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය පනතේ 72 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අධ්‍යාපන අමාත්‍ය බදිඋද්දීන් මහමූද් වන මම මෙම නියමයෙන් ඉහත කී 72 වන වගන්තිය ක්‍රියාත්මක වන දිනය වශයෙන් 1973 ජූලි මස පළමු වන දිනය නියම කරමි.

බදිඋද්දීන් මහමූද්,
අධ්‍යාපන අමාත්‍ය.

1973 මැයි මස 19 වැනි දින,
කොළඹ දී ය.

6-19—73.06.01 දින අංක 62 දරණ ගැසට් පත්‍රය

---

**සමගි මණ්ඩල පනත**

ආඥාව

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජූනි මස 12 වැනි දින අංක 11/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කිය විය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3(1), 3(8) හා 4(1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1970 අගෝස්තු මස 7 වැනි දින අංක 14,918 දරන ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතෙහි 3(2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උප ලේඛනයෙහි අංක 18 දරන ස්ථානයෙහි විස්තර කරනු ලැබූ මාතර දිස්ත්‍රික්කය තුළ පිහිටි බෙරලපනාතර ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායක සින්ගේ සභාවේ සාමාජිකයින් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙසින් පත් කරමි :—

(1) ඌරුබොක්ක, දම්පහල 'සිංහසෙවන' පදිංචි ධර්මදාස වික්‍රමසිංහ මහතා.
(2) කිරිලිපනේ, මොරගල පදිංචි ඩී. ජේ. සමරතුංග මහතා.
(3) බෙරලපනාතර, තලපැලකන්ද, බෝධිරුක්ඛාරාමවාසී පූජ්‍ය කැටවල ධම්මාවාස ස්වාමීන්වහන්සේ.
(4) කිරිලිපනේ, මොරගල මොලොග්ගමුව පදිංචි හෙට්ටිආරච්චිගේ කොර්නේලිස් ධර්මසේන මහතා.
(5) බෙන්ගමුව, මොලොග්ගමුව පදිංචි හෙට්ටිආරච්චිගේ පේමදාස මහතා.
(6) ඌරුබොක්ක, ගින්නලිය, කටුගහවත්ත පදිංචි අතාවුදගේ ප්‍රේමරත්න මහතා.
(7) බෙරලපනාතර, කැටවලගම, උ. තැ. කා. හි ධම්මික පේමසිරි සේපාල දහනායක මහතා.
(8) ඌරුබොක්ක, පැලපොල්වත්ත පදිංචි සෙ. යා. ගු. ප්‍රැන්සිස් මහතා.
(9) ඌරුබොක්ක, 'ගංගාශ්‍රී' හි පදිංචි සිමන්මේරු පතිරනගේ දොන් කොර්නේලිස් මහතා,
(10) ඌරුබොක්ක, ගින්නලිය පදිංචි තන්ත්‍රිගමගේ සාදිරිස් අප්පුහාමි මහතා.
(11) ඌරුබොක්ක, අලුවත්ත පදිංචි විජේසුන්දර දිසානායක නිලමේ මහතා.
(12) ඌරුබොක්ක, ගොඩේදෙනිය පදිංචි සූරියබණ්ඩාර විමලරත්න මහතා.
(13) ඌරුබොක්ක පදිංචි විදාන ගමගේ පින්තෝරිස් මහතා.
(14) ඌරුබොක්ක පදිංචි මැන්ඩිස් ලොකු බෝගහවත්ත මහතා.
(15) ඌරුබොක්ක, ගින්නලිය පදිංචි ගමඇතිගේ පේදිරිස් අප්පුහාමි මහතා.
(16) බෙරලපනාතර, කැකුන්දෙනිය පදිංචි ඒකනායකගේ සැම්සන් මහතා.
(17) බෙරලපනාතර, උඩුහුපිටිය පදිංචි ඩී. ඇල්. රාජපක්ෂ පතිරන මහතා.
(18) කිරිලිපනේ, මොරගල, කිරිලපන පදිංචි කඩවත ගමගේ සුවාරිස් විජේවික්‍රම මහතා.
(19) කිරිලිපනේ, මොරගල පදිංචි පනාකඩුව ගමගේ ගුණපාල මහතා.
(20) ඌරුබොක්ක, දම්පහල, අලුදෙනිය පදිංචි රූබසිංහ සියදෝරිස් අප්පුහාමි මහතා.
(21) බෙරලපනාතර, ආරච්චිගෙදර පදිංචි යසපාල ගමගේ මහතා.
(22) බෙරලපනාතර, විජයගම, මොදරහේන පදිංචි වඩුමුල්ලේ ගම්මාචාරිගේ චාර්ලිස් මහතා.
(23) බෙරලපනාතර, විජයගම, එගොඩහවත්ත පදිංචි මහප්පුබඩල්ගේ කිරිගෝරිස්හාමි මහතා.
(24) බෙරලපනාතර, අබකොලහේන, 'සඹරසෙවන' හි පදිංචි චාල්ස් සමරවිතාරණ මහතා.
(25) බෙරලපනාතර, 'වීරගිරි' හි පදිංචි වීරමන් නන්දසේන මහතා.
(26) බෙරලපනාතර, පදිංචි සයිනෝරිස් වික්‍රමගේ මහතා.
(27) බෙරලපනාතර, ඉලුක්පිටිය පදිංචි හෙට්ටිආරච්චිගේ සියදෝරිස් මහතා.
(28) ඌරුබොක්ක, කිරිපිටිය පදිංචි එඩ්වින් දහනායක මහතා,

(29) ඌරුබොක්ක, ඉමේහේන, කිරිපිටිය පදිංචි ඒ. ජී. විජේ වික්‍රම මහතා.
(30) ඌරුබොක්ක, දම්පහල, අඹගහවත්ත පදිංචි අලුත්ගේ අන්ද්‍රයස් මහතා.
(31) දෙනියාය, බටාදුර පදිංචි ඇස්. ඇල්. රත්නායක මහතා.
(32) ඌරුබොක්ක, හුලංබද්දකඩේ පදිංචි යග්ගහවිටගේ ජේම්ස් අප්පුහාමි මහතා.
(33) ඌරුබොක්ක, හීගොඩ පදිංචි කේ. ජානිසා මහතා.

(ආ) ඌරුබොක්ක, දම්පහල 'සිංහසෙවන' හි පදිංචි ධර්මදාස වික්‍රමසිංහ මහතා ඉහතකී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1973 මැයි මස 23 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

6–151/1—73.06.01 දින අංක 62 දරන ගැසට් පත්‍රය

---

### සමගි මණ්ඩල පනත

#### ආඥාව

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජුනි මස 12 වැනි දින අංක 11/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3(1), 3(8) හා 4(1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1972 සැප්තැම්බර් මස 8 වැනි දින අංක 24 දරන ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතෙහි 3(2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උප ලේඛනයෙහි අංක 7 දරන ස්ථානයෙහි විස්තර කරනු ලැබූ මාතලේ දිස්ත්‍රික්කය තුළ පිහිටි ඉනාමළුව කෝරළේ ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගි දායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි:—

(1) කිඹිස්ස පදිංචි අළුත්ගෙදර ඩිංගිරිබණ්ඩා මහතා.
(2) කිඹිස්ස ඉනාමලුව පදිංචි එච්. පී. සිල්වන් සිල්වා මහතා.
(3) කිඹිස්ස ඉනාමලුව පදිංචි පී. රාජපක්ෂ මහතා.
(4) කිඹිස්ස රොටවැව පදිංචි පී. කිරිබණ්ඩා මහතා.
(5) කිඹිස්ස, පදිංචි ඒ. ඇම්. බී. බණ්ඩා මහතා.
(6) සීගිරිය, කායන්වල පදිංචි ගමගෙදර බණ්ඩිරාල මහතා.
(7) සීගිරිය පදිංචි මානනේ ගේවගේ රොසලින් ගුණසේකර මිය.
(8) සීගිරිය, පොල්අත්තාව පදිංචි හේරත් මුදියන්සේලාගේ පිකිරිබණ්ඩා මහතා.
(9) සීගිරිය, පොල්අත්තාව පදිංචි අළුත්ගෙදර රම්බණ්ඩා මහතා.
(10) සීගිරිය, පිදුරංගල පදිංචි ගමගෙදර හේරත්හාමි මහතා.
(11) සීගිරිය, පිදුරංගල පදිංචි ලියනගෙදර කිරාල මහතා.
(12) සීගිරිය, අවුඩංගාව පදිංචි ගමගෙදර මුතුබණ්ඩා මහතා.
(13) සීගිරිය, අවුඩංගාව පදිංචි තෙන්නකෝන් මුදියන්සේලාගේ කවුරාල මහතා.
(14) ගෙඩිගස්වලාන පදිංචි හේරත් මුදියන්සේලාගේ පිකිරිබණ්ඩා මහතා.
(15) ගෙඩිගස්වලාන පදිංචි හේරත් මුදියන්සේලාගේ සේනානායක මහතා.
(16) දිගම්පතහ පදිංචි ගමගෙදර වීරකෝන් මහතා.
(17) දිගම්පතහ පදිංචි තලගහගෙදර හීංබණ්ඩා මහතා.
(18) කිඹිස්ස, නාගලවැව පදිංචි මිල්ලගහ ගෙදර පිකිරියා මහතා.
(19) සීගිරිය, තල්කොටේ පදිංචි ගමගෙදර රම්බණ්ඩා මහතා.
(20) සීගිරිය, තල්කොටේ පදිංචි බැද්දෙගෙදර ඩිංගිරිබණ්ඩා මහතා.
(21) ඉදිගස්වැව පදිංචි පිකිරිබණ්ඩා කුලතුංග මහතා.
(22) උඩවෙලයාගම පදිංචි වත්තේගෙදර පුංචිකිරා මහතා.
(23) සීගිරිය, දියකැපිල්ල පදිංචි ඒ. වන්නිහාමි මහතා (අළුත්ගෙදර වන්නිහාමි මහතා.)

(ආ) කිඹිස්ස පදිංචි අළුත්ගෙදර ඩිංගිරි බණ්ඩා මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1973 මැයි මස 23 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

6–151/2—73.06.01 දින අංක 62 දරන ගැසට් පත්‍රය

---

### සමගි මණ්ඩල පනත

#### ආඥාව

ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජුනි මස 12 වැනි දින අංක 11/2 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3 (1), 3 (8) හා 4(1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1972 සැප්තැම්බර් මස 8 වැනි දින අංක 24 දරන ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතෙහි 3 (2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උප ලේඛනයෙහි අංක 10 දරන ස්ථානයෙහි විස්තර කරනු ලැබූ මහනුවර දිස්ත්‍රික්කය තුල පිහිටි ගම්පහ බටහිර (උ.දු.) ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි.

(1) මාඩුගොඩ, මැදිවක පදිංචි අබේකෝන් අබේසිංහ මුදියන්සේලාගේ මැදිවක වලව්වේ පිකිරි බණ්ඩා මැදිවක මහතා
(2) හුන්නස්ගිරිය, බඹර බැද්ද පදිංචි උඩගෙදර උක්කුවා මහතා.
(3) මාඩුගොඩ, පල්ලේවෙල, මැදිවක පදිංචි ලුනුදුරු ගෙදර හුරතලා මහතා.
(4) මාඩුගොඩ, මාලිගා වලව්ව පදිංචි වටකැටියේ වලව්වේ පුංචිබන්ඩා මහතා.
(5) හුන්නස්ගිරිය, කෙවුල්ගමුව පදිංචි කරුනාධිපති කලෝගහ ගෙදර ඩිංගිත්තා වෙද මහතා.
(6) මාඩුගොඩ, මැදිවක, මැදිවක වලව්ව පදිංචි චන්ද්‍රපාල බණ්ඩා අධිකාරී එගොඩවෙල මහතා.
(7) හුන්නස්ගිරිය, බඹර බැද්ද පදිංචි පල්ලේ ගෙදර අප්පු හාමි මහතා.
(8) හුන්නස්ගිරිය, පිටිගොඩ පදිංචි සමරකෝන් මුදියන්සේලාගේ දෙමලකෝට්ටේ ගෙදර පිංහාමි මහතා.
(9) හුන්නස්ගිරිය, කෙවුල් ගම පදිංචි අබේසිංහ මුදියන්සේලාගේ අබොන් ගෙදර කිරි බණ්ඩා මහතා.
(10) හුන්නස්ගිරිය, නුගේතැන්න, පත්සලවත්ත පදිංචි අබේසිංහ මුදියන්සේලාගේ ගෙදර පිකිරි බන්ඩා මහතා.
(11) මාඩුගොඩ, හාල්යාල පදිංචි අබේසිංහ මුදියන්සේලාගේ මද්දුම බන්ඩා මහතා.
(12) මාඩුගොඩ, හාල්යාල පදිංචි උඩ වලව්වේ අබේරත්න බණ්ඩා මහතා.
(13) මාඩුගොඩ, මැදිවක පදිංචි යමනල ගෙදර පිකිරා මහතා.
(14) මාඩුගොඩ පදිංචි පයින්දගල වලව්වේ පිකිරි බන්ඩා මහතා,

(15) මාබුගොඩ, හාල්යාල පදිංචි දසනායක මුදියන්සේලාගේ තීන් බන්ඩා මහතා.

(16) මාබුගොඩ, මැදිරිය පදිංචි ජනාධිපතිගේ විදාරත්න මහතා.

(17) මාබුගොඩ, හාල්යාල පදිංචි වාසල මුදියන්සේලාගේ තින්දර කුඹුරේගෙදර අබේසිංහ බණ්ඩා මහතා.

(18) බෝපාන පදිංචි උඩ වලව්වේ ලොකු බණ්ඩා ගොඩ කුඹුර මහතා.

(19) මාබුගොඩ, මැදිවක පදිංචි වීරසේකර වාසල මුදියන්සේලාගේ මැදිවක වලව්වේ පුංචි බණ්ඩා මැදිවක මහතා.

(ආ) මාබුගොඩ මැදවක පදිංචි අබේකෝන් අබේසිංහ මුදියන්සේලාගේ මැදිවක වලව්වේ ටිකිරිබණ්ඩා මැදිවක මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු 3 ක් විය යුතු බවද මෙයින් නිශ්චය කරමි.

**රත්නසිරි වික්‍රමනායක,**
**නියෝජ්‍ය අධිකරණ ඇමති.**

1973 මැයි මස 23 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

6-151/3—73.06.01 දින අංක 62 දරණ ගැසට් පත්‍රය

---

## සමගි මණ්ඩල පනත

### ආඥව

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජූනි මස 12 වැනි දින අංක 11/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3 (1), 3 (8) හා 4 (1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1972 සැප්තැම්බර් මස 8 වැනි දින අංක 24 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතෙහි 3 (2) වන වගන්තිය යටතේ වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 20 දරන ස්ථානයෙහි විස්තර කරනු ලැබූ යාපනය දිස්ත්‍රික්කය තුළ පිහිටි නාරන්තනෙයි ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

(1) කයිට්ස්, කරම්පන් කොට්ඨාශ අංක 10 හි පදිංචි සුප්පයියා කතිරතම්බි මහතා.

(2) වේලනයි, සරවණයි කොට්ඨාශ අංක 1 හි පදිංචි ඉරාමලිංගම් නගුලේසපිල්ලෙයි මහතා.

(3) වේලණයි, සරවණයි කොට්ඨාශ අංක 2 හි පදිංචි කුමාරවේලු පද්මනාදන් මහතා.

(4) කයිට්ස්, පුලියන්කුඩල් කොට්ඨාශ අංක 3 හි පදිංචි සින්නයියා ගුරුසාමි මහතා.

(5) කයිට්ස්, පුලියන්කුඩල් කොට්ඨාශ අංක 4 හි පදිංචි සුප්පයියා කන්දයියා මහතා.

(6) කයිට්ස්, නාරන්තනයි කොට්ඨාශ අංක 6 හි පදිංචි කතිරවේලු තියාගරාසා මහතා.

(7) කයිට්ස්, නාරන්තනයි කොට්ඨාශ අංක 6 හි පදිංචි සුන්දරම්පිල්ලෙයි ඉරාමලිංගම් මහතා.

(8) කයිට්ස්, නාරන්තනයි කොට්ඨාශ අංක 6 හි පදිංචි නාගලිංගම් නඩරාසා මහතා.

(9) කයිට්ස්, නාරන්තනයි කොට්ඨාශ අංක 8 හි පදිංචි සවරිමුත්තු සුසයිතාසන් මහතා.

(10) කයිට්ස්, නාරන්තනයි කොට්ඨාශ අංක 8 හි පදිංචි සන්දියාපිල්ලෙයි පිරාන්සිස් මහතා.

(11) කයිට්ස්, නාරන්තනයි කොට්ඨාශ අංක 9 හි පදිංචි පොන්නම්බලම් ඉරාමනාදන් මහතා.

(12) කයිට්ස්, නාරන්තනයි කොට්ඨාශ අංක 9 හි පදිංචි නඩරාසා සිවසුබ්‍රමනියම් මහතා.

(13) කයිට්ස්, කරම්පන් කොට්ඨාශ අංක 10 හි පදිංචි කන්දයියා මුත්තුකුමාරු මහතා.

(14) කයිට්ස්, කරම්පන් කොට්ඨාශ අංක 10 හි පදිංචි නාගනාදර් ඉරත්නසභාපති මහතා.

(15) කයිට්ස්, කරම්පන් කොට්ඨාශ අංක 12 හි පදිංචි ඉලියතම්බි ඥණප්‍රකාසම් මහතා.

(16) කයිට්ස්, තරම්පන් කොට්ඨාශ අංක 11 හි පදිංචි නීක්කිලාපිල්ලෙයි යුවක්කීන්පිල්ලෙයි මහතා.

(17) කයිට්ස්, කරම්පන් කොට්ඨාශ අංක 11 හි පදිංචි නාගනාදි කනගසබයි මහතා.

(18) කයිට්ස්, කරම්පන් කොට්ඨාශ අංක 12 හි පදිංචි කෝසිලාම්පිල්ලෙයි ආනන්දවේල් මහතා.

(19) කයිට්ස්, තරම්පන් කොට්ඨාශ අංක 12 හි පදිංචි වේලුපිල්ලෙයි නාගරාසා මහතා.

(20) කයිට්ස්, තරම්පන් කොට්ඨාශ අංක 13 හි පදිංචි නාගරාසා සිවානන්දජෝදි මහතා.

(ආ) කයිට්ස්, කරම්පන් කොට්ඨාශ අංක 10 හි පදිංචි සුප්පයියා කතිරිතම්බි මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

**රත්නසිරි වික්‍රමනායක,**
**නියෝජ්‍ය අධිකරණ ඇමති.**

1973 මැයි මස 23 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

6-150—73.06.01 දින අංක 62 දරණ ගැසට් පත්‍රය

---

**මගේ අංකය : ඊඞී 26/010.**

## කෘෂිකර්ම සහ කර්මාන්ත ණය ඉදන ආයතනය

### අධ්‍යක්ෂ මණ්ඩලය

කෘෂිකර්ම සහ කර්මාන්ත ණයදෙන ආයතන ආඥ පනතේ 7(2) සහ 14 වැනි වගන්තිය යටතේ ගරු මුදල් ඇමතිතුමා විසින් 1972 පෙබරවාරි 29 වැනි දින සිට තුන් වසක කාලයක් සඳහා ඇන්, නාගේන්දිරම් මහතා කෘෂිකර්ම සහ කර්මාන්ත ණයදෙන ආයතනයේ අධ්‍යක්ෂවරයෙකු වශයන් පත් කරන්ට යෙදී ඇත.

එච්. ආර්. ද සොයිසා,
මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙනුවට.

6-152—73.06.01 දින අංක 62 දරණ ගැසට් පත්‍රය

**මිල පාලන පනත**

කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිල පාලක විසින් පනවනු ලැබ 1973 පෙබරවාරි 17 වැනි දින අංක : 47/1 දරණ ශ්‍රී ලංකා ජන රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද එෆ් සී/අයිචී/—1(50) දරණ (පාන්) මිල නියෝගය සහ එෆ් සී/අයිචී/එස් එෆ්/12 (8) දරණ (තිරිඟු පිටි) මිල නියෝගය විදේශීය හා දේශීය අමාත්‍ය වරයා විසින් 1973.05.11 දින අනුමත කරනු ලැබූ බව (173 වැනි අධිකාරය වන) මිල පාලන පනතෙහි 4 (7) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජයන්ත කැලේගම,
ලේකම්,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශය.

1973 මැයි මස 11 වැනි දින,
කොළඹ දීය.

6–157—73.06.01 දින අංක 62 දරන ගැසට් පත්‍රය

**මිල පාලන පනත**

මන්නාරම පරිපාලන දිස්ත්‍රික්කයේ සහකාර මිල (ආහාර) පාලක විසින් පනවනු ලැබ, 1973 පෙබරවාරි 15 වැනි දින අංක 47 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද අංක ඇම් ඇන් /1973/3 දරණ ආහාර මිල නියෝගය (පාන්) විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍ය වරයා විසින් 1973.05.12 වැනි දින අනුමත කරනු ලැබූ බව (173 වැනි අධිකාරය වන) මිල පාලක පනතේ 4(7) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජයන්ත කැලේගම,
ලේකම්,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශය.

1973 මැයි මස 14 වැනි දින,
කොළඹ දීය.

6–158—73.06.01 දින අංක 62 දරණ ගැසට් පත්‍රය

---

මගේ අංකය : ඊ. 23/කො. 779/71.

**කාර්මික ආරවුල් පනත—131 වන පරිච්ඡේදය**

1957 අංක 14 හා 62, 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරණ පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තිය යටතේ බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 1971 සැප්තැම්බර් මස 2 වන දින දරන නියෝගයෙන්, යොමු කරන ලදුව 1971 සැප්තැම්බර් මස 10 වැනි දින අංක 14,975 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද බී. ඩබ්ලිව්. ඒ. විතානගේ මහතා, 183 පයිප් පාර, කොළඹ 5 සහ සිලෝන් ටුබැකෝ කොම්පැණි ලිමිටඩ්, 108, ස්කිනර්ස් පාර-උතුර, කොළඹ 13, අතර පැවතුණු කාර්මික ආරවුල පිළිබඳව බේරුම්කරු විසින් මා වෙත එවන්නට යෙදුන තීරණය, ඉහත සඳහන් කරන ලද පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් පළ කරනු ලැබේ.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

1973 මැයි මස 17 වැනි දින,
කොළඹ 5, කම්කරු දෙපාර්තමේන්තුවේ දීය.

ඒ. 1084

බී. ඩබ්ලිව්. ඒ. විතානගේ මහතා

සහ

සිලෝන් ටුබැකෝ කොම්පැනි ලිමිටඩ්

**අතර පවතින කාර්මික ආරාවුල පිළිබඳවයි**

තීරණය

ගරු කම්කරු ඇමතිතුමා විසින් කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ ඉහත සඳහන් ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා අප වෙත යොමු කොට ඇත. ආරාවුලට හේතුවූ කාරණය වූයේ, සිලෝන් ටුබැකෝ කොම්පැනි ලිමිටඩ් හි පාලක පක්ෂය විසින් 71. 6. 28 වෙනි දින දරන ඔවුනගේ ලිපියෙන් බී. ඩබ්ලිව්. ඒ. විතානගේ මහතාගේ සේවය අත්හිටුවීම යුක්තිසහගතද යන්න හා ඔහුට කුමන සහනයන් හිමි වියයුතුද යන්නත්ය.

1971 ජූනි 24 වෙනිදා ඉල්ලුම්කරු වෙත පහත සඳහන් චෝදනා 4 ක් අඩංගු වූ චෝදනා පත්‍රයක් ඉදිරිපත් කරමින් වගඋත්තරකාර සමාගම ඉල්ලුම්කරුගේ සේවය අත්හිටුවා ඇත. **එම චෝදනා නම් :**

(1) 1970 දෙසැම්බර් 1971 මාර්තු දක්වා වූ කාලය තුළදී මුදලින් රුපියල් එක්දාහක් (රු. 1,000) තුට්ටු පඩුරක් වශයෙන් කුඩාවැව පළාතේ, සමාගම වෙනුවෙන් රාජකාරි ගණුදෙනු කරන දූම්උදුන් හිමියන්ගේ සංගමයෙන් නීති විරෝධී ලෙස භාර ගෙන තිබීම ;

(2) 1971 මාර්තු 31 වැනිදා සිට 1971 මැයි මස 6 වැනි දින දක්වා වූ කාලය තුළදී ඔහුගේ උසස් නිලධාරීන් වන ජ්‍යෙෂ්ඨ කොළ අධිකාරී තැනද, සහකාර කොළ කළමනාකාර තැනද (පරිපාලක) සහ කොළ කළමනාකාර තැනද විසින් ඉහත සඳහන් අංක 1 දරන චෝදනාව පිළිබඳව යම්කිසි පරීක්ෂණයක් පැවැත්වීම සඳහා පැමිණිය යුතු බවට ලියුම්, විදුලි පණිවුඩ සහ දුරකථනයෙන් කළ ඉල්ලීම් වලට මගහැර සිටීම ;

(3) 1971. 4. 6 වෙනිදා දින තරම කාල සීමාවේදී ත්‍රස්තවාදී ක්‍රියා ආරම්භ වූවාට පසු කාර්ය මණ්ඩලයද, අනෙක් ප්‍රාදේශීය අධිකාරීවරුන් ද ඉතා ලැදි කමින් ස්වකීය තනතුරු වල කටයුතු ඉටු කළද, ඉල්ලුම්කරු කුඩාවැව කාර්ය මණ්ඩලය තනිකර දමා ඔහුගේ තනතුර අවසර නොමැතිව අත්හැර යාම ;

(4) 71. 4. 6 වැනි දින සිට ජූලි 30 වෙනිදා දක්වා වන කාලය තුළදී ඔහුගේ කාර්ය මණ්ඩලයේ ඕවර්සියර්වරුන් දෙපොලක් වන ආර්. ජේ. ඊ. බී. දිසානායක සහ ඩී. එස්. ජයසිංහ යන මහතුන් රජයට විරුද්ධව ත්‍රස්තවාදී ක්‍රියාවලට පටලැවී ඇති බවට ඉල්ලුම්කරු විසින් අසත්‍ය පැමිණිල්ලක් පොලිසියට කර තිබීම වේ.

මෙම චෝදනා අතුරෙන් රුපියල් 1,000 ක් තුට්ටු පඩුරක් වශයෙන් කුඩාවැව පළාතේ උදුන් හිමියන්ගෙන් බාරගත් බව නඩුවට ඉදිරිපත් කොට ඇති ලිඛිත ප්‍රකාශයෙන් ඉල්ලුම්කරු පිළිගත්තේ වුව, ඒමත හෝ අනික් චෝදනා මත හෝ සම්පූර්ණ පරීක්ෂණයක් පවත්වන තුරු තමාගේ සේවය අත් හිටුවීම නීත්‍යානුකූල නොවන බව පෙන්වීමට මෙම ආරාවුල පිළිබඳව අප විසින් පරීක්ෂණයක් කළ යුතු යයි අයැද සිටි හෙයින්, පරීක්ෂණයක් පවත්වා ගෙන යන ලදී. මේ අනුව ආරාවුලට තුඩුදුන් කරුණු පිළිබඳව ඉල්ලුම්කරුගේත් වගඋත්තරකාර සමාගමේත් ලිඛිත ප්‍රකාශයක් නඩුපොතට ගොනුවූ පසු පරීක්ෂණයක් අරඹා ඉල්ලුම්කරුගේ සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සටහන් කර ගන්නා ලදී. උසාවියේ ඉල්ලීමත් දෙපක්ෂයේ වූ දීර්ඝ සාකච්ඡා වලටත් අනතුරුව මෙම නඩු විභාගය තවදුර දිග් ගැසෙන නිසාත් මෙම විභාගයේ තීරණය කුමක් වුව එම තීරණය රඳා නොපවතින නිසාත් ඉල්ලුම්කරු සේවයෙන් අත්හිටුවීම "දෙපක්ෂයේම අයිතිවාසිකම් වලට හානිකර නොවන පරිදි ඉවත් කිරීමට" වගඋත්තරකාර සිලෝන් ටුබැකෝ කොම්පැනි ලිමිටඩ් කැමති බව එම සමාගම වෙනුවෙන් පෙනී සිටි අධිනීතිඥ ආර්. ඒ. කන්නන්ගර මහතා 1972 දෙසැම්බර් 4 වෙනි දින දන්වන ලදී. මේ ඉල්ලීම අනුව තව දුරටත් සාකච්ඡා කෙරුණු අතර ඒ අවස්ථාවේදී ඉල්ලුම්කාර පක්ෂය කියා සිටියේ සමථයකට පත් කිරීම සඳහා වැඩ නතර කර තිබූ සම්පූර්ණ කාලය වෙනුවෙන් එනම් මාස 20 ක කාලය වෙනුවෙන් ඉල්ලුම්කරු සියලුම දීමනා ඇතුළත් වන සේ රුපියල් 71,858 ක් ලැබිය යුතු බව හා එයින් ලැබී ඇත්තේ රුපියල් 45,000 **ක් පමණක්** හෙයින් ඉතුරු රුපියල් 26,858 ක් ලැබිය යුතු බවය. එයට පසුව වූ සාකච්ඡාවෙන් එම රුපියල් 26,858 පිළිබඳ ප්‍රශ්නය ද නිරාකරණය කර ගන්නා ලදී. 1973 පෙබරවාරි මස 27 වෙනි දින විභාගයෙන් පසුව ඉතුරුව තිබුණු එකම ප්‍රශ්නය වූයේ ඉල්ලුම්කරු වැඩ නතර කර තිබූ මාස 20 කාලය සඳහා වෛද්‍යාධාර වශයෙන් රුපියල් 5000 ක් වගඋත්තරකාර සමාගම විසින් ගෙවිය යුතු වේද යන්නය.

මේ වකවානුව තුළ ඉල්ලුම්කරු ඉදිරිපත් කර ඇති සියලුම වෛද්‍ය බිල්පත් වලට ගෙවීමට වගඋත්තරකාර සමාගම කැමැත්ත දුන් පසු ඒ බිල්පත් ඉදිරිපත් කිරීම සඳහා ඉල්ලුම්කරුට එයට පසුවදා වන තුරු කල් දෙන ලදී. එදින තමාගේ අධිනීතිඥ මහතාගේ පුද්ගලික උවමනාවක් මත දිනයක් අයැද සිටිනා ලදී. ඒ අනුව 1973 මාර්තු 16 වෙනි දින නඩුව අඩ ගසන ලදී. එදින ඉල්ලුම්කරු රුපියල් 247.15 ක බිල්පත් ඉදිරිපත් කළෙන්, එය ගෙවීමට වගඋත්තරකාර සමාගම එකඟ වීමෙන් ඉල්ලුම්කරුගේ සේවය අත් හිටුවීම ඉවත් කිරීමේදී පැන නඟින ප්‍රශ්න සියල්ල නිරාකරණය විය. එහෙත් මේ අවස්ථාවේදී ඉල්ලුම්කරු වෙනුවෙන් පෙනී සිටින නීතිඥ සිවානන්දන් මහතා කියා සිටියේ මෙම ආරාවුල සමථයකට පත් කිරීමේ පළවෙනි කොන්දේසිය වන "දෙපක්ෂයේම අයිතිවාසිකම් වලට හානිකර නොවන පරිදි" යන වගන්තිය ඉවත් කළ යුතුය යන්නය. වගඋත්තරකාර සමාගම වෙනුවෙන් පෙනී සිටින අධිනීතිඥ කන්නන්ගර මහතා කියා සිටියේ මෙම නඩුව සමථයකට පත් කිරීමට ඒ මහතා එකඟ වූයේ ඉල්ලුම්කරුට විරුද්ධව නගා ඇති චෝදනා ගැන ක්‍රියා කිරීමට දෙපාර්තමේන්තු විභාගයක් කිරීමට ඉඩ හැර සේවය අත් හිටුවීම ගැන පමණක් බවත් මෙම ඉල්ලීමට කිසිසේත් එකඟ විය නොහැකි බවත්ය. මෙම ආරාවුලට තුඩුදී ඇති කාරණයට තිබෙන්නේ සේවය අත් හිටුවීමෙන් ඉල්ලුම්කරුට සිදුවී ඇති හානියක් වෙතොත් ඔහුට ලැබිය යුතු සහනයන් කවරේදැයි යන්න විසඳීමටය. ඒ සියල්ල දෙපක්ෂය විසින් එකඟව ඇති කොන්දේසි මත ඉටුවන බව අපට පෙනේ. මෙම අවස්ථාවේදී වගඋත්තරකාර සමාගම දෙපක්ෂයේම අයිතිවාසිකම් වලට හානිකර නොවන පරිදි

යන වගන්තිය මෙම සම්මුතියෙන් ඉවත් කිරීමට එකඟ නොවන්නේ නම් මෙම සමථයට ඒමට නොහැකි බව ඉල්ලුම්කරු වෙනුවෙන් පෙනී සිටින නීතිඥ මහතුන් කියා සිටියේය. ඒ අනුව මෙම නඩුව තව දුරටත් විභාග කර ගෙන යාමට අවශ්‍ය බව ඔවුන් දන්වන ලදී.

ඉල්ලුම්කරුගේ ප්‍රධාන සාක්ෂිය අප දැනටම සටහන් කර ගෙන ඇති හෙයින් ද අප වෙත එවා ඇති යොමු කිරීමට අනුව ඔහුට සැළසිය හැකි සියලුම සහනයන් දැනට වාර්තා කරගෙන තිබෙන සම්මුතියට අනුව ලැබෙන හෙයින් ද ඉල්ලුම්කරුගේ ලිඛිත ප්‍රකාශයන් නඩුවට අමුණා ඇති හෙයින් ද මෙම නඩුව තවදුරටත් විභාග කිරීම අවශ්‍ය බව අපට නොහැඟේ.

'නඩුවට අදාල සියලුම ප්‍රශ්නයන් පිළිබඳ ප්‍රධාන සාක්ෂි විමසීමෙන් පසුව ඉල්ලුම්කරුට මෙම විභාගයෙන් ලබා ගත හැකි සියලුම සහනයන් සැලසෙන පරිදි සමථයකට එළඹුනු පසු තමන් වෙනුවෙන් එතෙක් පෙනී සිටි නීතිඥ මහතුන් ඉවත් කොට වෙනත් අය පත් කර ගෙන ආ ඉල්ලුම්කරු සමථයකට පත්කිරීමේ පලවෙනි කොන්දේසිය වන "දෙපක්ෂයේම අයිතිවාසිකම් වලට හානිකර නොවන පරිදි" යන වගන්තිය ඉවත් කළ යුතු යයි ඉල්ලා සිටීම කිසිසේත් සාධාරණ යුක්තිසහගත ඉල්ලීමක් නොවේය යනු අපගේ හැඟීමයි. එහෙයින්, දෙපක්ෂයේම කැමැත්තෙන් ඒ එකඟත්වයට හානි නොවන පරිදි පහත සඳහන් ආකාරයට මෙම ආරාවුල සමථයකට පත් කරමි.

(1) ඉල්ලුම්කරුගේ වැඩ අත් හිටුවීම දෙපක්ෂයේම අයිතිවාසිකම් වලට හානි නොවන පරිදි වගඋත්තරකාර සිලෝන් ටුබැකෝ කොම්පැනි ලිමිටඩ් ඉවත් කර ගත යුතුය.

(2) 1973 මැයි 21 වෙනි දින සිට ඉල්ලුම්කරු සේවයට ගැනීමට වගඋත්තරකාර සිලෝන් ටුබැකෝ කොම්පැණි ලිමිටඩ් කළ යුතුය. එදින ඉල්ලුම්කරු සේවයට යා යුතුය. පිළිගතහැකි හේතුවක් නොදක්වා එදින ඉල්ලුම්කරු සේවයට නොගිය හොත් ඔහු සේවය අත්හැර ගිය අයකු හැටියට සැලකෙනවා ඇත.

(3) 1972 අගෝස්තු අවසානය දක්වා ඉල්ලුම්කරු භාරයේ වග උත්තරකාර පක්ෂයට අයත් නිවස තිබුණ හෙයින්, සේවය අත් හිටවූ දා සිට 1972 අගෝස්තු දක්වා ගෙවල් කුලී ඉල්ලුම්කරුට ලබා ගත නොහැක්කේය.

(4) 1972 අගෝස්තු සිට 1973 පෙබරවාරි අවසානය දක්වා මසකට රුපියල් 300 බැගින් රුපියල් 1,800 ක් ගෙවල් කුලී සඳහා වගඋත්තරකාර සමාගම ඉල්ලුම්කරුට ගෙවිය යුතුය.

(5) සේවය නතර කර තිබූ කාලය සඳහා රුපියල් 600 ක් සිගරට් දීමනා හැටියට ඉල්ලුම්කරුට වගඋත්තරකාර පක්ෂය විසින් ගෙවිය යුතුය.

(6) වාර්ෂික පඩි වැඩිකිරීම් හා බෝනස් දීමනා යනුවෙන් ඉල්ලුම්කරු අයැද සිටි රුපියල් 13,250 ඉල්ලීම ඉල්ලුම්කරු පිළිබඳ වෙනත් පරීක්ෂණයක් සමාගම මගින් නොපවත්වන්නේ නම් ඒ පිළිබඳ සාධාරණ තීරණයක් විධායක මණ්ඩලය නොපමාව ගත යුතුය.

(7) එම තීරණය ඉල්ලුම්කරු පිළිගත යුතුය.

(8) ඉල්ලුම්කරුට විරුද්ධව වෙනත් පරීක්ෂණයක් පවත්වනුයේ නම් මේ ඉල්ලීම් පිළිබඳ දීමනා එම පරීක්ෂණයේදී වන තීරණයට අනුව පිළිගැනීමට ඉල්ලුම්කරු එකඟ විය යුතුය.

(9) සේවය නතර කර තිබූ කාලය සඳහා ඉදිරිපත් කොට ඇති වෛද්‍ය බිල්පත් වලට අනුව රුපියල් 247.15 ක් වග උත්තරකාර පක්ෂය විසින් ඉල්ලුම්කරුට ගෙවිය යුතුය. මේ සියලුම මුදල් ඉල්ලුම්කරුට ලබා ගැනීම සඳහා වග උත්තරකාර පක්ෂය විසින් 1973 ජූලි මස 31 වෙනි දින හෝ ඊට ප්‍රථම දකුණු කොළඹ සහකාර කම්කරු කොමසාරිස් තුමාගේ කාර්යාලයේ තැන්පත් කළ යුතුය. එයට පසු එම මුදල් ඉල්ලුම්කරුට ලබා ගත නොහැක.

මෙම තීරණය සාධාරණවූත්, යුක්තිසහගතවූත් තීරණයක් බවට සහතික කරමින් 1973 අප්‍රේල් මස 9 වෙනි දින කොළඹ 5, නාරාහේන්පිට පිහිටි කාර්මික අධිකරණයේදී මෙම තීරණය ප්‍රදානය කරන ලදී.

ප්‍රඥාපාල ශ්‍රී ගුණවර්ධන,
බේරුම්කරු.

1973. 4. 9 වන දින,
කොළඹ දීය.

6-114—73.06.01 දින අංක 62 දරණ ගැසට් පත්‍රය

---

අංක : සී/අයි. 54.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමිතකර දක්වා ඇති කාරණාව පිළිබඳව ලංකා වෙළඳ සේවක සංගමය, 22 1/1, ඉහළ චැතැම් වීදිය, කොළඹ 1 සහ බ්‍රෝඩ් ඇන්ඩ් කොම්පැණි ලිමිටඩ්, 19, ඉහළ චැතැම් වීදිය, කොළඹ 1, අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කොළඹ 4, සාන්ත පීතර පෙදෙසේ අංක 21 හි පදිංචි එම්. මතියාපරනම් මහතා වෙත මෙයින් යොමු කරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 මැයි මස 10 දින,
කොළඹ දීය.

---

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත**

ලංකා වෙළඳ සේවක සංගමය, 22 1/1, ඉහළ චැතැම් වීදිය,
කොළඹ 1.,

සහ

බ්‍රෝඩ් ඇන්ඩ් කොම්පැණි ලිමිටඩ්, 19, ඉහළ චැතැම් වීදිය,
කොළඹ 1.,

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරවුලට හේතුවී ඇති කරුණ නම්, (සමාගම් ඒකාබද්ධ කළ දිනවන) 1966 මාර්තු 1 වන දින සිට (සිලෝන් බෲවරි ලිමිටඩ්හි රියැදුරන්ට ගෙවන ලද වේතනය හා සමාන වේතන ගෙවූ දිනය වන) 1968 ජනවාරි 1 වන දින දක්වා, සිලෝන් බෲවරි ලිමිටඩ්හි රියැදුරන්ට ගෙවන ලද වේතනය හා සසඳා හිඟ වේතන වෙනස තම සමිතියේ සාමාජිකයන් වන බ්‍රෝඩ් ඇන්ඩ් කොම්පැණි ලිමිටඩ්හි රියැදුරන්ටද ගෙවන ලෙස කරන ලංකා වෙළඳ සේවක සංගමයේ ඉල්ලීම යුක්ති සහගතද යන්නත් ඔවුන් එකිනෙකාට කුමන සහනයක් හිමිද යන්නත් පිළිබඳව වේ.

1973 මැයි මස 4 වැනිදා වූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

6-117—73-06.01 දින අංක 62 දරණ ගැසට් පත්‍රය

---

මගේ අංකය : පී. 7/1067.

**131 පරිච්ඡේදය වන කාර්මික ආරවුල් පනත**

131 පරිච්ඡේදය වන සංශෝධිත කාර්මික ආරවුල් පනතෙහි 3 (1) (ඈ) වගන්තිය යටතේ බේරුම් කිරීම සඳහා යොමු කරන ලද කොළඹ 1 හි, යෝක් වීදියේ, යෝක් ගොඩනැඟිල්ලෙහි 94 1/6, ජාතික කම්කරු සංගමය සහ වෙයාකාප් පුව, තෙල් මෝල අයිතිකාර ජේ. පැට්රික් මයිකල් පීන්තු මහතා අතර පවතින කාර්මික ආරවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් මා වෙත එවා ඇති ප්‍රදානය එකී පනතෙහි 18 (1) වන වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඩබ්ලිව්. ඇල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

1973 මැයි මස 17 වැනි දින,
කොළඹ 5, කම්කරු දෙපාර්තමේන්තුවේ දීය.

**ඒ. 1191**

**ජාතික කම්කරු සංගමය**

**සහ**

ජේ. ප්‍රැට්රික් මයිකල් පින්තු මහතා

**අතර පවතින කාර්මික ආරවුල**

**තීරණය**

ශ්‍රම කම්කරු කොමසාරිස් තුමා විසින් කාර්මික ආරවුල් පනතේ 3 (1) (ඩී) වගන්තිය යටතේ ඉහත සඳහන් ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා මා වෙත පමුණුවා ඇත.

වෙන්නප්පුව තෙල් මෝල අයිතිකාර ජේ. ප්‍රැට්රික් මයිකල් පින්තු මහතා සහ ඉහත කී ජාතික කම්කරු සංගමය අතර ආරවුලට හේතු වූ කාරණය වූයේ වග උත්තරකරු 1972 ජූනි මස 20, 22 දින ජාතික කම්කරු සංගමයේ සාමාජිකයින් වූ ඩබ්ලිව්. ඩී. සිරිල් සැම්සන්, ඩබ්ලිව්. ලෙයාඩ්. ප්‍රනාන්දු සහ ලයනල් පීරිස් යන සේවකයින් ඔවුන් සේවය කළ වැඩ අංශයෙන් වෙනත් අංශයකට මාරුකිරීම සාධාරණද? ඔවුන් එකිනෙකාට ලැබිය යුතු සහනයන් කවරේද යන්නත් ගැනවේ.

මෙම යොමු කිරීම මෙම උසාවිය වෙත එවූ පසු ඉල්ලුම්කාර පක්ෂයට සහ වගඋත්තරකාර පක්ෂයට මෙම ආරවුලට හේතුවූ ඇති කාරණා පිළිබඳව ඔවුන්ගේ විස්තර ප්‍රකාශයක් එවන මෙන් දන්වා 1972 ඔක්තෝබර් මස 4 වෙනි දින කාර්මික අධිකරණය මගින් දැන්වීම් යවා ඇත. එය යවා ඇත්තේ ලියාපදිංචි කළ තැපැලෙනි. එයට පිළිතුරු වශයෙන් ඉල්ලුම්කාර පක්ෂය වන ජාතික කම්කරු සංගමය ඔවුන්ගේ ප්‍රකාශය ඉදිරිපත් කොට ඇත. වගඋත්තරකරු අද වෙනතුරුද කිසිම ප්‍රකාශයක් ඉදිරිපත් කොට නැත. 1972.12.19 වෙනි දින මෙම ආරවුල පිළිබඳ විභාගයක් පැවැත්වෙන බව දන්වා දෙපාර්ශයටම මෙම අධිකරණය මගින් දැන්වීම යවා ඇත. එසේ වුවද, එම විභාග දිනයේදී පැමිණ සිටියේ ඉල්ලුම්කාර පක්ෂය පමණයි. වගඋත්තර කාර පක්ෂය වන ජේ. ප්‍රැට්රික් මයිකල් පින්තු නමින් එවා ඇති විදුලි පණිවිඩයක් එදින උදේ 11.55 ට පමණ කාර්මික අධිකරණය වෙත ලැබී ඇත. "හෙට පැමිණීමට අපහසුය. වෙන දිනයක් දෙන්න. අංකය : ඒ. 1191 ප්‍රැට්රික් පින්ටෝ, වෙන්නප්පුව" එම විදුලි පුවතේ සඳහන් වී ඇත්තේ ඉහත සඳහන් වාක්‍යයය. එම විදුලි පුවතින් පැමිණීමට ඇති අපහසුව කවරේද යන්නවත් සඳහන් නොකෙරේ. අධිකරණයේ නියමයට අනුව යථා කාලයේදී ප්‍රකාශයක්ද ඉදිරිපත් නොකොට අවසාන මොහොතේ කිසිදු සැලකිය යුතු හේතුවක් නොපෙන්වා කරන මෙවැනි ඈඳුමකට ඉඩදීම නඩුවේ අනික් පාර්ශ්වයට කරදරයක් හිරිහැරයක් වන්නේය. වියපැහැදම් කොට ගෙන කාලය ගෙවාගෙන, අධිකරණය වෙත පැමිණි අය කලකිරීමකින් යුතුව ආපසු යැවීම යුක්තිසහගත නොවන්නේ ය යනු අපගේ හැඟීමයි. එසේම උසාවිය වෙත සැලකීමක් ගෞරවයක් නොදක්වා උසාවියටත්, අනික් පාර්ශවකරුවන්ටත් වන හිරිහැර වියදම් ගැන නොසලකා විදුලි පුවතකින් දිනයක් ඇයැදූ පමණකින් නඩු විභාගය කල් දැමීම කිසිසේත් යුක්ති සහගත නොවේ. එම නිසා ඉල්ලුම්කාර පක්ෂය වෙනුවෙන් පෙනී සිටි ඒ. ලොඩ්විඩ් මහතාට ඒකපාක්ෂිකව විභාගය සඳහා සාක්ෂි මෙහෙය වන ලෙස නියම කෙළෙමි.

නඩුවේ අනික් විභාග දිනයේදී කම්කරුවන්ගේ පඩි වාර්තා ගෙන එන මෙන් වගඋත්තරකරුට ලියාපදිංචිතැපැලෙන් සිතාසි යවා ඇති නමුදු ඔහු පැමිණියේ හෝ එම පඩි වාර්තා වෙනත් අයෙකු මගින් එවූයේද නැත. මුල් දිනයේ වගඋත්තරකරු විසින් නඩු විභාගයට පැමිණීමට අපහසු බවත්, වෙන දිනයක් අයදින බවත් දන්වා විදුලි පුවතක් එවා ඇත. ඊට පසු මෙම උසාවියට ඇවිත් මීළඟ නඩු දිනයක් වෙතොත් එය බලා ගැනීමට ඔහුට ඉඩ තිබුනි. ඔහු එවැනි ප්‍රයත්නයක් හෝ කර නැත. මුල් නඩු දිනයේ අවසාන මොහොතේ විදුලි පුවතක් එවූ ආකාරයටම මෙදිනද නඩු විභාග වන අවස්ථාවට ලැබෙන පරිදි ලියාපදිංචි තැපැලෙන් ලිපියක් එවා ඇති බව පෙනේ. මෙයින් පෙනී යන්නේ මෙම වගඋත්තරකරු මෙම විභාගය මග හැරීමට තැත් කරන බවය. එය කෙසේ වෙතත්, දින දෙකේම විදුලි පුවතක් හා ලිපියක් එවා ඇති හෙයින් ඔහුට විරුද්ධව දඬුවමක් වශයෙන් ගතහැකි පියවරක් ගැනීමට අදහස් නොකරමි.

ඉල්ලුම්කාර පක්ෂය වෙනුවෙන් සිරිල් සැම්සන්, ලෙනාඩ් ප්‍රනාන්දු ලයනල් පීරිස්, වෝල්ටර් විජේමාන්න, ඇන්ටනි ලොඩ්විඩ් යන මහතුන් සාක්ෂි දුන්හ. ඔවුන්ගේ සාක්ෂි වලින් හා ඒ. 1 සිට ඒ. 4 දරන ලියවිලි වලින් පෙනෙන අන්දමට කරුණු මෙසේ ය :—

1971 දී වගඋත්තරකරුගේ ආයතනයේ සේවකයින් විසින් ජාතික කම්කරු සංගමයේ ශාඛාවක් මෙහි පිහිටුවා ගෙන ඇත. 71. 11. 8 වෙනිදා එම සංගමය පිහිටුවා ගත් බවට ආයතනයේ අයිතිකාර වගඋත්තරකරුට දන්වා ඇත. මෙම නඩුවේ ආරාවුලට සම්බන්ධිත කම්කරුවන් තිදෙනා අතුරෙන් සිරිල් සැම්සන් සංගමයේ ලේකම් හැටියටද, ලෙනාඩ් ප්‍රනාන්දු සභාපති හැටියටද, ලයනල් පීරිස් උද්යෝගිමත් සාමාජිකයෙක් හැටියටද ක්‍රියා කොට ඇත. කම්කරු සමිතිය පිහිටවූ අවධියේ ඔවුන් අතුරෙන් සිරිල් සැම්සන් සහ ලෙනාඩ් ප්‍රනාන්දු උණු වතුර අංශයේ ලයනල් පීරිස් පොල් කැපීමේ අංශයේද සේවය කොට ඇත.

71. 11. 8 වෙනි දින අලුතෙන් පිහිටුවන ලද සමිතිය පිළිබඳ දැනැවීමක් යථා පරිදි අයිතිකරු වෙත ඉදිරිපත් කොට ඇත. මේ මාරු කිරීම් කර ඇත්තේ මින් අනතුරුවය. අවුරුදු ගණනාවක් තිස්සේ කිසිදු දඬුවමකට මාරු කිරීමකට පත් නොවී සේවය කරන ලද මෙම සේවකයින් අලුතෙන් සමිතියක් පිහිටුවා නිලතල වලට පත්වී ක්‍රියා කිරීමට පටන් ගත් පසු ඔවුන්ගෙන් කරන පළි ගැනීමක් වශයෙන් මෙම මාරු කිරීම් කර ඇති බව සාක්ෂි වලින් සනාථ වේ.

මේ වැඩ මාරුව නිසා සිරිල් සැම්සන්ට රුපියල් 200 ක් පමණද ලෙනාඩ් ප්‍රනාන්දුට රුපියල් 150 ක් පමණ ද ලයනල් පීරිස්ට රුපියල් 400 ක් පමණ ද වේතනයන් හා වැඩ කරන දවස් ගණන අඩු වීමෙන් මෙතෙක් වූ අලාභයක් හැටියට ගණන් බැලීමේදී අපට පෙනී ගොස් ඇත.

වගඋත්තරකරු වෙනුවෙන් එවා ඇති ලිපියෙහි මෝලෙහි වැඩ නැති බව හෙළිකොට ඇති හෙයින් ඉල්ලුම්කරුවන්ගේ පාඩුව ගණන් බැලීම 1973 ජනවාරි මස දක්වා පමණක් සීමා කොට ඇත. මේ අනුව, 1972 මැයි මස 20 වෙනිදාට පෙර වැඩ කළ අංශයන් වන සිරිල් සැම්සන් සහ ලෙනාඩ් ප්‍රනාන්දු උණුවතුර අංශයටද, ලයනල් පීරිස් පොල් මැනීමේ අංශයටද 1973 මැයි 1 වෙනිදා සිට මාරු කරන මෙන්ද, ඔවුන්ගේ සාමාන්‍ය වේතනයෙන් අඩුවී ඇති මුදල හැටියට සිරිල් සැම්සන්ට රුපියල් 200 ක් ද (රුපියල් දෙසීයයි) ලෙනාඩ් ප්‍රනාන්දුට රුපියල් 150 ක් ද (රුපියල් එකසිය පනහයි) ලයනල් පීරිස්ට රුපියල් 400 ක්ද (රුපියල් හාරසීයයි) 1973 මැයි 1 වෙනිදා සිට තෙමසක් තුළ නැතහොත් අගෝස්තු 1 වෙනිදා හෝ එයට ප්‍රථම ගෙවන මෙන්ද, එම මුදල දකුණු කොළඹ සහකාර කම්කරු කොමසාරිස් තැන වෙත තැන්පත් කිරීමෙන් පසු ඉල්ලුම්කරුවනට එය ගෙවන මෙන්ද නියම කරමින් මෙම ප්‍රදානය 1973 අප්‍රේල් මස 9 වෙනි දින කොළඹ 5, නාරාහේන්පිට කාර්මික අධිකරණයේදී ප්‍රදානය කරන ලදී.

තවද, මෙම තීරණය යුක්තිසහගතවූත්, සාධාරණවූත් තීරණයක් බවට සහතික කරමි.

ප්‍රජාපාල ශ්‍රී ගුණවර්ධන,
බේරුම්කරු.

1973. 4. 9 වන දින,
කොළඹ දීය.

6–118—73.06.01 දින අංක 62 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ඩී.—ඩී. 207/41.

**පඩිපාලක සභා ආඥාපනත**

6 (2) වැනි වගන්තිය යටතේ නිවේදනය

මෙහි පහත දැක්වෙන ආඥාව (136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 6 (1) වැනි වගන්තිය යටතේ මවිසින් පනවා ඇති බව ඒ ආඥාපනතේ 6 (2) වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහතකී ආඥාව 1973 ජූනි මස පළමු වැනි දින සිට වලංගු විය යුතු ය.

ඇම්. පී. ද ඉසෙඩ් සිරිවර්ධන,
කම්කරු අමාත්‍ය.

1973 මැයි මස 23 වැනි දින,
කොළඹ දීය.

**උපලේඛනය**

පඩිපාලක සභා ආඥාපනතේ II වන කොටස් විධිවිධාන මෙහි පහත සඳහන් කර්මාන්තයට අදාල විය යුතු ය :—

පහත දැක්වෙන කවර එක් කාර්යයකින් හෝ කාර්යයන් ගණනාවකින් යුක්ත වූ දැව හා වඩු කර්මාන්තය, එනම් :—

(I) දැව කැපීම, දැව කඳන් කිරීම, දැව ඉරීම හා දැව සකස් කිරීම ;

(II) ගෘහ භාණ්ඩ නිෂ්පාදනය ; හා

(III) ලී පෙට්ටි නිෂ්පාදනය.

පහත දැක්වෙන වැඩවල යෙදී සිටින කම්කරුවන්ගේ වැඩ ද ඊට ඇතුළත්—

(1) කඳන් ඉරන්නන් (යාන්ත්‍රික) ;
(2) කඳන් ඉරන්නන් (අත් කියත් මගින්) ;
(3) ලී ඉරන්නන් (අත් කියත් මගින්) ;

(4) රෝදයට කඳන් අල්ලන්නන් ;
(5) කඳන් හරහට කපන්නන් ;
(6) ගස් කපන්නන් ;
(7) කඳන් පෙරලන්නන් ;
(8) කඳන් ගෙනැවිත් දෙන්නන් ;
(9) කඳන් අදින්නන් ;
(10) කඳන් බාන්නන් ;
(11) ලී අච්චි ගසන්නන් ;
(12) ලී බාන්නන් ;
(13) ලී පටවන්නන් ;
(14) ඉරන ලද ලී අඩුක් කරන්නන් ;
(15) ඉරන ලද ලෑලි අඩුක් කරන්නන් ;
(16) ලී මනින්නන් ;
(17) දරට ලී වෙන් කරන්නන් ;
(18) ලී තෝරා අඩුක් කරන්නන් ;
(19) ලී මෝල් වැඩ පරීක්ෂකයින් ;
(20) කියත් සකසුවන් ;
(21) ටිම්බර් ජැක් ඔපරේටර්වරුන් ;
(22) දම්වැල් කියත් ක්‍රියාකරුවන් ;
(23) පුහුණුවන්නන් ;
(24) ලෑලි ගාන්නන් ;
(25) ලෑලි කපන්නන් ;
(26) අලවු ඉරන්නන් ;
(27) හුලස් ගාන්නන් ;
(28) සවි කරන්නන් ;
(29) තට්ටු තබන්නන් ;
(30) තට්ටු ඇන ගසන්නන් ;
(31) පළල ඉරන්නන් ;
(32) කුඩිම්බි කපන්නන් ;
(33) පැල්ලම් ගාන්නන් ;
(34) ලෑලි මනින්නන් ;
(35) හතරැස් කරන්නන් ;
(36) නෙත්ති කපන්නන් ;
(37) ලී පෙට්ටි සාදන්නන් ;
(38) වඩුවන් ;
(39) ලී විදින්නන් ;
(40) යතු ගාන්නන් ;
(41) ලීස්තර කපන්නන් ;
(42) කැටයම් කපන්නන් ;
(43) ලී කොටස් පුරුද්දන්නන් ;
(44) ගෘහ භාණ්ඩ සාදන්නන් ;
(45) දොර ජනෙල් රාමු කපන්නන් ;
(46) විසිතුරු භාණ්ඩ කපන්නන් ;
(47) කැබිනට් සාදන්නන් ;
(48) වීදුරු සවි කරන්නන් ;
(49) කුෂන් කරන්නන් ;
(50) පොලිෂර්වරු ;
(51) වැලිකඩදාසියෙන් මදින්නන් ;
(52) මට්ටම් කරන්නන් ;
(53) රෙදි කපන්නන් ;
(54) කුෂන් සවිකරන්නන් ;
(55) පුටු වියන්නන් ;
(56) නුපුහුණු කම්කරුවන් ;
(57) මුරකරුවන් ;
(58) දැව හා වඩු කර්මාන්තයෙහි නියුක්ත වෙනත් කම්කරුවෝ.

එහෙත් පහත දැක්වෙන කම්කරුවන්ගේ වැඩ ඇතුළත් නොවේ.

(අ) ලිපිකරුවෝ, කැෂියර්වරු, ගබඩා භාරකරුවෝ, වේලා සටහන් කරුවෝ සහ සැරකරුවෝ ;

(ආ) 1963 ජූනි මස 29 වන දින අංක 13,690 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළවූ ආඥාවෙහි නිශ්චිතව සඳහන් මෝටර් රථ ගමනාගමන කර්මාන්තයෙහි නියුක්ත කම්කරුවෝ ;

(ඇ) 1944 ජනවාරි මස 7 වන දින අංක 9,224 දරන ගැසට් පත්‍රයේ පළකරනු ලැබ පසුව සංශෝධිත ආඥාවෙහි නිශ්චිතව සඳහන් ඉන්ජිනේරු කර්මාන්තයෙහි නියුක්ත කම්කරුවෝ.

6-143—73.06.01 දින අංක 62 දරණ ගැසට් පත්‍රය

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**1958 අංක 29 දරණ සත්ව පනත**

අම්පාර දිස්ත්‍රික්කයේ අක්කරපත්තු ප්‍රා.ආ.නි. කොට්ඨාශයේ ගවයින් හංවඩු ගැසීම සඳහා තෝරා ගන්නා ලද ස්ථාන හා දිනයන්—1973

| ග්‍රා.සේ. අංකය | ග්‍රා.සේ. කොට්ඨාශයේ නම | හංවඩු ගැසීමේ දිනය | හංවඩු ගැසීමේ ස්ථානය |
|---|---|---|---|
| 10 | තිරුක්කෝවිල් | ජූනි මස සිට සැප්තැම්බර් මස දක්වා සෑම මසකම පළමුවන හා දෙවන බදාදා දිනවල—1973 | ග්‍රාම සේවක කාර්යාලය |
| 11 | කො.අංක. 2, තම්බිලුවිල් | එම | එම |
| 12 | කො.අංක. 1, තම්බිලුවිල් | එම | එම |
| 13 | පනන්කාඩු | එම | එම |
| 15 | කො.අංක. 1, අක්කරපත්තුව | එම | එම |
| 16/17 | කො.අංක. 2/3, අක්කරපත්තුව | එම | එම |
| 18/19 | කො.අංක. 4/5, අක්කරපත්තුව | එම | එම |
| 20 | කො.අංක. 6, අක්කරපත්තුව | එම | එම |
| 21 | කො.අංක. 7, අක්කරපත්තුව | එම | එම |
| 22 | කො.අංක. 8/9, අක්කරපත්තුව | එම | ප ශු වෛද්‍ය නිලධාරී, කාර්යාලය, අක්කර පත්තුව |
| 30 | කො.අංක. 3/4, අඩ්ඩාලච්චේන | එම | ග්‍රාම සේවක කාර්යාලය |
| 31 | කො.අංක. 2, අඩ්ඩාලච්චේන | එම | එම |
| 33 | කො.අංක. 1, අඩ්ඩාලච්චේන | එම | එම |
| 34 | පාලමුනෙ | එම | එම |
| 35 | ඔලුවිල් | එම | එම |
| 35ඒ | දීඝවාපිය | එම | ග්‍රා.සං. සමිතිය—දීඝවාපිය |

ඩී. විජේසිංහ,
අම්පාර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත,

1973.5.14 වන දින,
අම්පාර කච්චේරියේ දීය.

6-70—73.06.01 දින අංක 62 දරණ ගැසට් පත්‍රය

සමාග. 12

**සමාගම් ආඥාපනත (145 වැනි අධිකාරය)**

277 (5) වගන්තිය යටතේ දිඹුල ට්‍රාන්ස්පෝටර්ස් ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම

සමාගම් ආඥාපනතේ (145 වැනි අධිකාරය) විධි විධාන යටතේ 1955 ඔක්තෝබර් මස 3 වැනි දින සංස්ථාපිත සමාගමක් වන දිඹුල ට්‍රාන්ස්පෝටර්ස් ලිමිටඩ් ව්‍යාපාරික කටයුතු වල නිරත වී නැති බව, නොහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින් ද,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, එදින සිට තුන් මාසයක් ඉකුත් වූ විට, දිඹුල ට්‍රාන්ස්පෝටර්ස් ලිමිටඩ් නම රෙජිස්ටරයෙන් කපා හරින බවට, 1972 දෙසැම්බර් 08 දින අංක 37 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙන්, 1972 නොවැම්බර් 08 වැනි දින දරණ දැන්වීමක් පළ කරන ලද හෙයින් ද,

දිඹුල ට්‍රාන්ස්පෝටර්ස් ලිමිටඩ් ඉහත කී තුන් මාසයේ කාල සීමාව තුළ එසේ නොකිරීමට හේතු දක්වා නොමැති බැවින් ද,

අද දින, දිඹුල ට්‍රාන්ස්පෝටර්ස් ලිමිටඩ් නම සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින ලද බවද, ඉහත කී සමාගම් විසුරුවා හරින ලද බවද, වැඩ බලන වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් තැන්පත් වයිරමුත්තු සිදම්බරපිල්ලේ නඩරාජන් වන මම සමාගම් ආඥාපනතේ (145 වැනි අධිකාරය) 277 (5) වැනි වගන්තිය යටතේ, මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

වී. එස්. නඩරාජන්,
වැඩ බලන සමාගම් රෙජිස්ට්‍රාර්.

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ 1,
1973.04.26 දින.

6-77—73.06.01 දින අංක 62 දරණ ගැසට් පත්‍රය

---

සමාග. 11

**සමාගම් ආඥාපනත (145 වැනි අධිකාරය)**

277 (3) වගන්තිය යටතේ ද සිරිපති වෙළඳ කම්පැණි ලිමිටඩ් නම කපාහැරීමේ දැන්වීම

සමාගම් ආඥා පනතේ (145 අධිකාරය) විධිවිධාන යටතේ 1957.2.20 දින සංස්ථාපිත සමාගමක් වන ද සිරිපති වෙළඳ කම්පැණි ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ද සිරිපති වෙළඳ කම්පැණි ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම් විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් තැන්පත් රුවන්පුර ලික්මන් ද සිල්වා වන මම, සමාගම් ආඥා පනතේ (145 අධිකාරය) 277 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ආර්. එල්. ද සිල්වා,
සමාගම් රෙජිස්ට්‍රාර්.

1973 මැයි මස 7 දින,
කොළඹ, සමාගම් රෙජිස්ට්‍රාර්ගේ
දෙපාර්තමේන්තුවේ දීය.

6-120—73.06.01 දින අංක 62 දරණ ගැසට් පත්‍රය

---

මගේ අංකය: එල්. ඊ. ජී./එල්/152

(එල්. ඊ. 586)

**ජාතික නිවාස දෙපාර්තමේන්තුව**

උකස් කරනු ලැබූ ඉඩම්, ජාතික නිවාස ආඥා පනතේ (ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 401 වැනි පරිච්ඡේදය) අංක 76 දරණ වගන්තිය යටතේ හා 1966 අංක 36 දරණ (සංශෝධිත) පනත යටතේ විකිණීම සඳහා බලය දීම

ජාතික නිවාස ආඥා පනතේ අංක 9(1) ක් දරණ වගන්තිය යටතේ සහ එයට අදාල සංශෝධන පනත් යටතේ පත් කරනු ලැබූ, ජාතික නිවාස සහකාර කොමසාරිස් වන සින්නතම්බි වෙල්ලයියා වන මම ශ්‍රී ලංකා ජනරජය වෙනුවෙනුත් සඳහාත් ක්‍රියා කරමින් යාපනයේ සිනම්කර්නි හි මුරුගේසු කන්දයියා සුබ්‍රමණියම් ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද 1968. 08. 05 වැනි දින අංක 7785 දරණ උකස්කරය යටතේ මුදල් ගෙවීම පැහැර ඇති බැවින්, ඉලවාලෙයි 'ලිසියා ඉල්ලාම්' හි පදිංචි අන්තෝනි පිල්ලෙයි සන්තියාපිල්ලෙයි මහතාගෙන් සහ මේරි තෙරේසා සන්තියාපිල්ලෙයි මහත්මියගෙන් 1973. 05. 05 වැනි දින තෙක් ගෙවිය යුතු රුපියල් දහනමදාස් හතළිහයි ශත පනහයි (රු. 19,040.50) 1973.04.10 වැනි දිනට පසු ගෙවන ලද මුදල් හැර අයකර ගැනීම සඳහාත්, එසේම 1973. 05. 05 වැනි දින සිට විකිණීම පැවැත්වෙන දිනය හෝ සම්පූර්ණයෙන් ගෙවන දිනය දක්වා තවදුරටත් වූ රුපියල් දහතුන්දහස් එකසිය තුනයි ශත විසිදෙක (13,103. 22) ක මුදලක් සම්බන්ධයෙන් වන පොලී මුදල වර්ෂයකට සියයට 7 ප්‍රමාණයට යථෝක්ත උකස්කරය ප්‍රකාර 1973. 05. 05 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් එකතු වන සියළුම දඩ මුදල් සමග අයකර ගැනීමත්, එසේ අයකර ගැනීමේදී ඇරීමට සිදුවන වියදම් සහ ගාස්තු අය කර ගැනීම සඳහාත්, මීට අමුණා ඇති උප ලේඛනයේ දක්වා ඇති ඉඩම් සහ එයට අදාල සියළු දේත්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිණිස ආඥා නිකුත් කර, එසේ විකිණීම සඳහා යාපනයේ පළමුවන හරස් වීදියේ කේ. සුබ්‍රමනියම් ප්‍රසිද්ධ වෙන්දේසිකරුට බලය දෙමි.

එස්. වෙල්ලයියා,
ජාතික නිවාස සහකාර කොමසාරිස්.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
පරණ කච්චේරි ගොඩනැගිල්ල,
යාපනය.
1973. 05. 14 වැනි දින.

**පළමුවන උප ලේඛනය**

උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ පණ්ඩතෙරප්පු වලිගාමම් බටහිර සිරුවිලන් හි පිහිටි 'අතුව මිකුලම්' නැමැති ඉඩම ඒ. ලාසරස් බලයලත් මිනින්දෝරු මහතා විසින් සාදන ලද 1966.05.10 දිනැති නො. 3305 දරණ සැළැසුමේ ප්‍රකාර, ලාචම් 4 වී. සී. ඇතත් දැනට ලාචම් 3 වී. සී. සහ කුලී 16 විශාලත්වය ඇති නැගෙනහිරට සන්තියාපිල්ලෙයි ගේ වැන්දඹුව වූ ඥානම්මාට අයිති ඉඩම ද උතුරට පවුපාරද බටහිරට ඇන්තනිපිල්ලෙයි සෙබස්තියන් පිල්ලෙයි ගේ ඉඩමද දකුණට සෙබස්තියන් පිල්ලෙයි ගේ බිරිඳ වන අයියර්ලාට සහ බී. ඒ. සමරකෝන් ගේ බිරිඳ වන ආනා මේරිට අයත් ඉඩම ද මායිම් වන යාපනය දිස්ත්‍රික් ඉඩම් කන්තෝරුවේ වෙළුම් ඊ. 308 සහ පිටු 186 යටතේ ලියාපදිංචිව ඇති ගොඩනැගීමට ඇති ගෙයක් ද, අයත් වේ.

6-35—73.06.01 දින අංක 62 දරණ ගැසට් පත්‍රය

---

**1952 තිස්සමහාරාම වන්දනා රෙගුලාසි**

1952 තිස්සමහාරාම වන්දනා රෙගුලාසිවල 3 වන රෙගුලාසිය ප්‍රකාර, හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත, දොන් හැරි අබේගුණසේකර වන මම පහත සඳහන් කාලයන්, 1952 තිස්සමහාරාම වන්දනා රෙගුලාසි බලපවත්වන කාලයන් වශයෙන් මෙයින් නියම කරමි.

**1973 පොසොන් උත්සවය—තිස්සමහාරාමය**

1973 ජූනි 10 වන දින සිට ජූනි 16 වන දින දක්වා (දෙදිනකම ඇතුළුව).

**1973 ඇසළ උත්සවය—තිස්සමහාරාමය**

1973 ජූලි 01 වන දින සිට ජූලි 16 වන දින දක්වා (දෙදිනකම ඇතුළුව).

ඩී. එච්. ජේ. අබේගුණසේකර,
හම්බන්තොට දිස්ත්‍රික්කයේ දිසාපති.

1973 මැයි මස 14 දින,
හම්බන්තොට දිසාපති කාර්යාලයේ දීය.

6-20—73.06.01 දින අංක 62 දරණ ගැසට් පත්‍රය

**1971 අංක 1 දරණ හදිසි (කුඹුරු) නියෝග**

1971 අංක 1 දරණ හදිසි (කුඹුරු) නියෝගවල අංක 3 දරණ නියෝගයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නියෝජ්‍ය ගොවිජන සේවා කොමසාරිස් කරුණාදස වීරවර්ධන වන මම, මෙහි පහත සඳහන් ගොවි කාරක සභාවෙහි සියළුම බලතල, යුතුකම් හා කාර්යයන්, ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට හෝ කිරීමට මෙහි පහත සඳහන් අයට මෙයින් බලය පවරමි :—

| ගොවි කාරක සභාවේ නම | දිස්ත්‍රික්කය | නිලධාරියාගේ නම | පදවි නාමය | කවර දිනක සිටද යන වග |
|---|---|---|---|---|
| උනාලේ ... | ... කුරුණෑගල | ... වීකිරිබණ්ඩා කහවත්තේ | ... ගොවිජන සේවා ප්‍රාදේශීය නිලධාරි ... | 72.10.15 |

කේ. වීරවර්ධන,
නියෝජ්‍ය ගොවිජන සේවා කොමසාරිස්.

1973 මැයි මස 14 දින,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
අංක 42, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 7

6–73—73.06.01 දින අංක 62 දරණ ගැසට් පත්‍රය

### ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

**(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)**

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිට ය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවක් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සෙනසුරාදා පෙරවරු 8 සිට දවල් 12 දක්වාද, වෙනත් දිනවල පෙරවරු 8 සිට පස්වරු 3.30 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුයි.

4. සෙනසුරාද පෙරවරු 11ට සහ වෙනත් දිනවල පස්වරු 2.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක්පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෝෂ වලක්වා ගැනීම සඳහා, පළකරන්නට නියමිත "පිටපත" කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ පචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, ශ්‍රේෂ්ඨ උසාවියේ රෙජිස්ට්‍රාර් මහතාගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 20 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාද දිනයකම ශ්‍රී ලංකා ජනරජයේ "ගැසට්" පත්‍රය පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. 1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ, මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන්නට එවිය යුතුයි.

13. 1968.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු* :—

ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රය—වාර්ෂික

| | මෙරට | | | පිටරට | |
|---|---|---|---|---|---|
| | රු. | ශ. | | රු. | ශ. |
| එක් කොන්වය ... ... ... | 46 | 0 | ... | 60 | 0 |
| I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 36 | 0 | ... | 42 | 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් .. ... | 48 | 50 | ... | 51 | 50 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ කිසි වක සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණ ය.

* තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | මිළ | | | තැපැල් ගාස්තු මෙරට | |
|---|---|---|---|---|---|
| | රු. | ශ. | | රු. | ශ. |
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී එක කොටසක් ... | 0 | 50 | ... | 0 | 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... | 1 | 0 | ... | 0 | 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡේදයක් | 0 | 30 | ... | 0 | 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, I වැනි කොටසේ එක ඡේදයක් ... | 0 | 60 | ... | 0 | 15 |

දායක මුදල් භාර ගැනීම සහ තනි පිටපත් විකිණීම භාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

## උපලේඛනය
## 1973

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව |
|---|---|---|
| මැයි ... | 73.05.04 සිකුරාද ... | 73.04.27 සිකුරාද දවල් 12.00 |
| | 73.05.11 සිකුරාද | 73.05.04 සිකුරාද දවල් 12.00 |
| | 73.05.18 සිකුරාද | 73.05.11 සිකුරාද දවල් 12.00 |
| | 73.05.25 සිකුරාද ... | 73.05.18 සිකුරාද දවල් 12.00 |
| ජූනි .. | 73.06.01 සිකුරාද ... | 73.05.25 සිකුරාද දවල් 12.00 |
| | 73.06.08 සිකුරාද ... | 73.06.01 සිකුරාද දවල් 12.00 |
| | 73.06.14 බ්‍රහස්පතින්ද ... | 73.06.08 සිකුරාද දවල් 12.00 |
| | 73.06.22 සිකුරාද ... | 73.06.14 බ්‍රහස්පතින්ද දවල් 12.00 |
| | 73.06.29 සිකුරාද ... | 73.06.22 සිකුරාද දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. සිරිමණ,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින.

ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.